# අහ්ලුස් සුන්නත් වල් ජමාඅත්වරුන්ගේ මූලික විශ්වාසය

﴿ مجمل أصول أهل السنة والجماعة في العقيدة ﴾

[ Sinhalese – سنهالي ]

මහාචාර්ය: නාසිර් අබ්දුල් කරීම් අල් අක්ල

පරිවර්තනය: මුහම්මද් නලීම් ඉස්සදීන

2011 - 1432

IslamHouse.com

ඉස්ලාමීය විශ්වාසය

# مجمل أصول أهل السنة والجماعة في العقيدة

**باللغة السنهالية**

**تأليف**

**أ.د. ناصر بن عبد الكريم العقل**

**ترجمة:**

**محمد نظيم عز الدين**

المكتب التعاوني للدعوة والإرشاد بالربوة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
ص.ب:٢٩٤٦٥ الرياض ١١٤٥٧ البديعة: تلفون ٤٤٥٤٩

## පරිවර්තකගෙන වචනයක් .....

මෙම පොත් පිංච කියවන පාඨකයාගේ මනස තුල සලෆුස් සාලිහීන් වරුන් (පෙර විසූ යහපත් දනන්) තුල පැවැති අගනා වටිනා ඊමාන් (විශ්වාසය) පිළිබඳ අවබෝධයක් ඇති කරවයි. මෙම කෘතියෙහි කර්තෘ පවසන ආකාරයට මෙය අහ්ලුස් සුන්නාහ් වල් ජමාඅත්වරුන්ගේ විශ්වාසය පිළිබඳ විස්තරාත්මක පොත් පිංචක් නොව, මුජ්මල් හෙවත් සංක්ෂිප්ත ලෙස ලියවුනු එකකි. එබැවින් මෙම කෘතියෙහි ඇති විශේෂ ලක්ෂණය නම් අකීදා (විශ්වාසය) පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම කෙරෙහි පාඨකයා දිරිගන්වන සුළු ආකාරයට කෙටියෙන් ලියවී තිබීමයි. එබැවින් ඉස්ලාමය හදාරන නවකයින්ට හා ආධුනිකයන් හට මෙම කෘතියෙහි සඳහන් සමහර කරුණු එකවර වටහා ගැනීමට නොහැකි වීමට පුළුවන. එබැවින් මෙම පොත මුල්කරගෙන සලෆීවරුන් අනුගමනය කරන විද්වතුන් ලවා පුළුල් දැනුමක් ලබාගැනීම කෙරෙහි උනන්දු වෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. පරිවර්තනය භාරදූර වගකීමකි. එබැවින් පමණට වඩා භාෂා විලාසය අලංකාර කිරීමට වඩා මුල් පිටපතහි අර්ථයට හානියක් හෝ කැළලක් සිදුනොවීම කෙරෙහි මගේ තියුනු අවධානය යොමු විය. පරිවර්තනයේදී උපදෙස් ලබාදීම තුලින් මග පෙන්වූ අශ්ශෙයික් අසදුල්ලාහ්

(මදනී)තුමා මෙම පොත මනාව පරීක්ෂාකර එහි අඩුපාඩු පෙන්වා දුන් මව්ලවි මුහම්මද් සෆරුල්ලාහ් ඇතුළු සියළු දෙනාටම අල්ලාහ් තආලාගේ විශිෂ්ඨවූ ප්‍රතිපල ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

අල්හම්දු ලිල්ලාහ්

Movlavi:- Mohammed Naleem Izzudeen

## ගැට පද විවරණය

***යව්මුල් කියාමා*** - අවසන් දිනයේදී මරණයට පත්වූ සියළු දෙනාට නැවත පණ පොවා නැගිටවනු ලබන දිනය **යව්මුල් ආඛිරහ්** - භවයෙහි අවසන් දිනය **සිරාත්**-එදින සියළු දෙනාම තරනය කරන සිරාත් හෙවත් පාලම **මීසාන්** - මිනිසාගේ හොඳ හා නරක තක්සේරු කරනු ලබන තරාදිය **අල් අර්ශ් වල් කුර්සියියු** - අල්ලාහ් (රාජාසනාරූඪව) සිටින ස්ථානය **අල් ජන්නාහ්**- ස්වර්ගය **අන් නාර්**- නිරය **ශරීආ** - ඉස්ලාමීය නීති පද්ධතිය **ඉමාම්** - (මෙම කෘතියෙහි සඳහන් ආකාරයට) සාමූහික (ජමාඅත් සලාතය) මෙහෙයවන්නා

**ජිහාද්** (මෙහි අර්ථය පුළුල්ය.)- කෙනෙකුට සිය ජීවිතයේ දායාදයක් ලෙස ලැබී ඇති මුළු ශක්ති ප්‍රමාණය අල්ලාහ් උදෙසා කැප කිරීම.

## සංඥාපනය

සියළු ප්‍රශංසා අල්ලාහ් තආලාටම හිමිවේ. අපි ඔහුව ප්‍රශංසා කරමු. ඔහුගෙන පිහිට පතමු. අපගේ අකුසල් ක්‍රියාවන් සඳහා ඔහුගෙන් සමාව අයද සිටිමින්, පශ්චාත්තාප කරමින්, ඔහු වෙතටම පියමං කරමු. අපගේ සිත් සතන් තුලින් හටගන්නා නපුරෙන් හා කයෙන් (ක්‍රියාවෙන්) සිදුවෙන අකුසලින් මිදීමට හා වැළකී සිටීමට අල්ලාහ් තආලාගෙන් පමණක් ආරක්ෂාව පතමු. අල්ලාහ් විසින් නිවැරදි මාර්ගයෙහි යොමුකල අයවලුන් නොමග යැවීමට කිසිවෙකුට නොහැක. එමෙන්ම නොමග යැවූ අයවලුන් නිවැරදි මාර්ගයට යොමු කිරීමටද කිසිවෙකුට නොහැක. අල්ලාහ් තආලා හැර වෙන දෙවියෙකු නැත. ඔහු ඒකකයෙකි. ඔහුට සමාන කිසිවක් නැත; යනුවෙන් සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ සේවකයකු හා ඔහුගේ පණිවිඩ කරුවෙකු බවටද සාක්ෂි දරමි.

මෙම පොත් පිංච අකීදා (විශ්වාසය) පිළිබඳ අහ්ලුස් සුන්නත් වල් ජමාඅත් වරුන් දරණ මත හා වත්පිළිවෙත් පිළිබඳ කෙටි අර්ථකථනයකි. අපගේ දැහැමි පැරන්නන් (සලෆුස් සාලිහීන්) තුල දක්නට ලැබුණු අකීදාවෙහි මූලික කරුණු හා එහි නීති රීති ගැන කෙටියෙන්, පැහැදිලි භාෂා ශෛලයෙන් හා

හැකි පමණින් ශරීආවට අනුකූල වචන පමණක් භාවිතා කරමින් ගෙනහැර දක්වන ලෙස ශිෂ්‍යයන්ගේ හා පොදු ජනයාගේ ඉල්ලීම ඉටු කරීම වස් මෙය සකස්කර ප්‍රකාශනයට පත් කරමි. ඉමාම් වරුන් විසින් දැනුම් දෙන ලද ශරීආ ව්‍යවහාරයට අනුකූලවූ වචන පමණක් හැකි පමණින් භාවිතා කළෙමි. එබැවින් සමහර විට අත්‍යාවශ්‍යයැයි හැඟෙන පැහැදිලි කිරීම්, හැඳින්වීම්, අර්ථ විවරණ, සාදක හා නම් සඳහන් කිරීම්, හුවා දැක්වීම්, අතිරේක සටහන් යනාදිය මෙහි අන්තර් ගතවී නැත. සැහැල්ලුවෙන් හා අඩු වියදමකින් මෙම පොත් පිංච පාඨකයන් අතට පත් විය යුතුයැයි අදහස් කල බැවින් ඉහත සඳහන් කරුනු වලක්වාලීමට සිදුවිය. මෙම විෂය සම්බන්ධව නිපුනත්වයක් දරණ විද්වතෙකු විසින මෙම කෘතියෙහි සඳහන් නොවූ බොහෝ කරුණු ඇතුලත් කරමින් මීට වඩා වැඩි විස්තර ඇතුලත් ග්‍රන්ථයක් පාඨක අතට පත් කිරීමට ඉන්ශා අල්ලාහ් මෙම පොත් පිංච රුකුලක් වෙනු ඇතයි බලාපොරොත්තු වෙමි. මෙම පොත් පිංච අශ්ශෙයික් අබ්දුර් රහ්මාන් බින් නාසිර් අල් බර්රාක්, අශ්ශෙයික් අබ්දුල්ලාහ් බින් මුහම්මද් අල් ගුනෙයිමාන්, මහාචාර්ය හම්සා බින් හුසෙයින් අල්ෆහ්ර්, මහාචාර්යඃ සිෆ්ර් බින් අබ්දුර් රහ්මාන් අල් හවාලී, යන උගතුන්හටද ඉදිරි

පත් කරන ලදි, ඔවුහු නිහතමානී ලෙස අවශ්‍ය උපදෙස් හා සටහන් ලබා දීම තුලින් මට සහයෝගය දැක්වූහ.විශේෂයෙන් අතිරේක සටහන් ලබා දෙමින් මා දිරිගැන්වූ මආලී අශ්ෂෙයික් සාලිහ් බින් පව්Zසාන් අල් පව්Zසාන් තුමාගේ මෙහෙයද මෙහිදී සඳහන් කල යුතුයි. ඒ සඳහා ඔවුන් හට අල්ලාහ් තආලාගේ යහපත් ප්‍රථිපල ලැබේවා! මෙම උත්සාහය අල්ලාහ්ගේ තෘප්තිය පමණක් බලාපොරොත්තු වෙමින්, ඔහු වෙනුවෙන් කල මෙහෙයක් බවට පත්වීමට අල්ලාහ් තආලාගෙන් ප්‍රාර්ථනා කරමු. ලෝකවාසී ජනයාට ආශිර්වාදයක් සේ පහළ කරන ලද අප නබි මුහම්මද් (සල්) තුමා වෙතද එතුමාගේ ශ්‍රාවකවරුන් ඔවුන්ව නිසිලෙස අනුගමනය කල සියළු දෙනා වෙතද අල්ලාහ් අවසන් දිනය දක්වා ඔහුගේ කරුණාව හා ආශිර්වාදය ලබා දෙත්වා!

හිජ්රි3-9-1411 නාසිර් බින් අබ්දුල් කරීම් අල් අක්ල්

## ප්‍රාරම්භය

අකීදා යන අරාබි වචනයේ සිංහල අර්ථය ගැටය, (සන්ධිය) ස්ථිරත්වය, සියුම් ලෙස පැවැතීම, ශක්තිමත්ව බැඳීම යන්නයි. සාමාන්‍ය ව්‍යවහාරයේදී අකීදා යනු විශ්වාස වන්තයෙකු විසින් යම් කිසි

කරුණක් සම්බන්ධව කිසිදු සැකයකින් තොරව අචල ලෙස විශ්වාස කිරීමයි.

**"ඉස්ලාමීය අකීදා"** යනු අල්ලාහ් තආලා, අල්ලාහ්ගේ ඒකදේවවාදය හා ඔහුට යටහත්භාවය දැක්වීමේ අවශ්‍යතාවය පිළිබඳවත් ඔහුගේ මලාඉකාවරුන්,(දේවදූතයන්) ආගම්, රසූල්වරුන් (පණිවිඩකරුවන්) අවසන් දිනය, දේව කැමැත්ත (පූර්ව සැළැස්ම) පිළිබඳවත්, දැනුමට සම්බන්ධ හෝ ක්‍රියාවට සම්බන්ධ අදෘශ්‍යමාන විවිධ කරුණු, පණිවිඩ, හා මූලික මූලධර්මයන් පිළිබඳවත්, සැකයකින් තොරව විශ්වාස කිරීම; යන අර්ථය දක්වයි.

**අස්සලෆ්** (පැරන්නන් ) යන වදන ඉස්ලාමයේ විශිෂ්ඨවූ පළමු සියවස් තුන තුල ජීවත්වූ අති ශ්‍රේෂ්ඨ සහාබාවරුන්, තාබිර්න්වරුන්, හා ඍජු මග ගිය ඉමාම් වරුන්ව හඳුන්වයි.මොවුහු මෙම උම්මතය හෙවත් සමාජයේ බීජ වස්තුවයි. සසර පුරා මෙම අයවලුන්ව අනුගමනය කරමින් දිවි පෙවත ගත කරන්නන් "සලෆී"හෙවත් "පැරන්නන්ව අනුගමනය කරන්නන්" යනුවෙන් හඳුන්වමු.

මුහම්මද් නබි (සල්) තුමාණන් හා එතුමාගේ සහාබාවරුන් ගත්මග අනුව සිය ජීවිතය ගොඩ

නගා ගත් පිරිස් **අහ්ලුස් සුන්නා වල්ජමාඅත්** යනුවෙන් හඳුන්වමු.
මොවුහු මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ සුන්නාහ් හෙවත් එතුමාගේ ජීවන සැලැස්ම තිරසාර ලෙස පිළිගෙන අනුගමනය කිරීමේ හේතුවෙන් **අහ්ලුස් සුන්නා** යනුවෙන් හඳුන්වනු ලැබූහ.

සත්‍ය මාර්ගයේ එක් සිත්ව හා එක්සත්ව කටයුතු කරමින් සත්‍ය ධර්මයේ පිල්වලට බෙදීමකින් තොරව සමගි වෙමින් සත්‍ය ධර්මයට අනුකූලව ජීවත්වූ නායකයන් ගත් මග හෙලා දැකීමකින් තොරව ඒවා අනුගමනය කරමින් හා මෙම උම්මතයේ ජීවත්වූ පැරන්නන් ඒකමතිකව ගත් තීරණ ඒ ආකාරයටම අනුගමනය කරමින් ජීවත් වන සන්ධානය වන බැවින් **"ජමාඅත්"යනුවෙන් හඳුන්වනු ලැබූහ.**

මෙම ජමාඅතය රසූල් (සල්) තුමාණන්ගේ (ජීවන සැළැස්ම) සුන්නාහ්ව හා එතුමාණන් විසින් ප්‍රකාශයට පත් කල දේ ඇති සැටියේ අනුගමනය කරන බැවින් (අල් කුර්ආනය සහ අල්හදීසය අනුගමනය කරන්නන් යන අර්ථය ලබා දෙන) අහ්ලුල් හදීස්, අහ්ලුල් අසර්, අහ්ලුල් ඉත්තිබා යන විරුදාවලියෙන්ද හඳුන්වමු. තවද අත්තාඉෆතුල් මන්සූරා, (දේව උපකාරය ලද කණ්ඩායම) "අල්ෆිර්කතුන් නාජියා" (ජයග්‍රාහනය ලද කණ්ඩායම) යනුවෙන්ද හඳුන්වනු ලබයි.

## පළවෙනි කොටස

## අකීදා විෂය දැන ගැනීමට හා ඒ සඳහා වූ සාධක වටහා ගැනීමට අදාල නීති රීති හා මූලධර්මයන්

1) ඉස්ලාමීය විශ්වාසය හෙවත් අකීදාවෙහි මූලධර්මය යනු අල්ලාහ්ගේ අල්-කුර්ආනය හා ඔහුගේ රසූල්ගේ සුන්නාහ් යනුවෙන් ස්ථිර ලෙස දැනුම් දෙන ලද දේ හා යහ මග ගියාවූ පැරන්නන් (සලෆිවරුන්) දැරූ ඒකමතික අදහස්ද වේ.

2) නබි (සල්) තුමාණන්ගේ සුන්නාහ් (ජීවනමග) යනුවෙන් කිසිදු සැකයකින් තොරව තහවුරු කරන ලද දේ පිළිගැනීම හා එය අනුව ක්‍රියා කිරීම අනිවාර්ය වගකීමක්වේ. එබැවින් මේ සම්බන්ධව බහුතරයක් විසින් දැනුම් දීමකින් තොරව, විශ්වාස කල හැකි කිහිප දෙනෙකු විසින් දැනුම් දුන් විටක හෝ මේ හා සමාන වෙනත් ක්‍රමයකින් දැනුම් දුන් විටක එය පිළිගැනීම අනිවාර්ය වේ.

3) අල්කුර්ආනය සහ අස්සුන්නාහ්ව අවබෝධ කර ගැනීමට ඇති මාර්ගෝපදේශය නම් එයට අදාල අල්කුර්ආන් අල්හදීස් වදන් සහ යහමග ගිය පැරන්නන් සහ ඔවුන් අනුගමනය කළ අය පැහැදිලි කල විවරණයන්ද වේ. මෙසේ ස්ථිර කරන ලද

අදහසක් ගෙන හැර දැක්වීමෙන් පසු භාෂාමය ව්‍යවහාරයට අනුව පැවතිය හැකි අනුමානයන් හේතුකරගෙන පමණක් ප්‍රතික්ෂේප කිරීමට නොහැක. එසේ නොපිළිගන්නේ නම් එය වැරදි සහගත ක්‍රියාවකි.

4) ඉස්ලාම් ධර්මයට අදාල සියළුම මූලධර්මයන් හා එහි ප්‍රතිපත්ති මාලාවන් පිළිබඳව මුහම්මද් නබි (සල්) තුමා විසින් සක්සුදක්සේ පැහැදිලි කර ඇත. එබැවින් ඉස්ලාම් ධර්මයට ඇතුලත් මූලධර්මයක්ය යනුවෙන් අළුතින් (හඳුන්වාදීම) සඳහා කිසිවක් නිර්මාණය කිරීමට කිසිවෙකුට කිසිවිටක අනුමැතියක් නැත.

5) බාහිර වශයෙන් හා අභ්‍යන්තර වශයෙන් අල්ලාහ්ට හා අල්ලාහ්ගේ රසූල්ට අවනතවීම අනිවාර්යවේ. අල්ලාහ් තආලාගේ දේව වාක්‍යයෙහි කිසිවක් හෝ ඔහුගේ රසූල්ගේ සුන්නා යනුවෙන් සැකයකින් තොරව තහවුරු කරනලද දෙයින් කිසිවක් කියාස් හෙවත් අනුකරණය කිරීම තුලින්, තමන්ගේ රුචිඅරුචිකම් අනුව වටහාගැනීම තුලින් කශ්ෆු හෙවත් වරදවා අර්ථකථන කිරීම යන කරුණු මුල් කරගෙන හෝ විද්වතුන්ගේ හා ඉමාම් වරුන්ගේ අදහස් යනාදී කරුණු සාධක වශයෙන් මුල් කරගෙන හෝ වෙනත් ක්‍රමයකින් වරදවා තේරුම් ගැනීමෙන් වැළැකී සිටිය යුතුයි.

6) බුද්ධියට ගැළපෙන සත්‍යවූ ඕනෑම විෂයක අවසන් තීරණය සැමවිටම අල්කුර්ආන් සහීහ් හදීස් යනාදියට සුදුසු උචිත ආකාරයට සකස් විය යුතුයි.

බුද්ධි මට්ටමට ගැලපෙන විෂයක් සම්බන්ධව අල්කුර්ආන් සහ අල් හදීස් ඉගැන්වීම් තුල දක්නට ලැබෙන්නේ නම් එම කරුණු අතර පරස්පර විරෝදී වෙනස් කම් දක්නට නොලැබේ. මෙම කරුණු අතර වෙනස්කම් දක්නට ලැබෙන්නේ නම් අල්කුර්ආන් සහ අල්හදීස් ඉගැන්වීම් වලට පමණක් මුල්තැන ලබාදිය යුතුයි.

7) අකීදා සම්බන්ධ විෂයෙහි සැම විටම ශරීආව තුලින් උපන් වචන භාවිතා කිරීමට හා හුදෙක්ම මිනිසුන් විසින් නිර්මානය කරන ලද නවීන වචන භාවිතයෙන් වැළකීසිටීමට වගබලා ගත යුතුයි. හරි හෝ වැරදි යන දෙකටම භාජනය විය හැකි අපැහැදිලි වචන නිවැරදි කර නිසියාකාරව තේරුම් ගැනීමට උත්සහ කිරීම අනිවාර්යවේ. අර්ථානුසාරයට අයත් සත්‍ය වචන නිවරදි ශරීආ ව්‍යවහාරයට අනුකූලව පිළිගනු ලැබේ. අර්ථවත් නොවූ අසත්‍ය වචන පිළිගැනීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8) නබි (සල්) තුමාණන් සියළු අකුසල් ක්‍රියාවන් වලින් ආරක්ෂා කරනු ලැබූහ. එමෙන්ම (ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය අනුව) සමස්තයක් වශයෙන් මුළු මහත් මුස්ලිම් සමාජයම ප්‍රධාන පෙලේ නොමග යැවෙන සුළු කරුනුවලට එකඟවීමෙන් ආරක්ෂා කරනු ලැබ සිටිති. නමුත් මෙවැනි ආරක්ෂාවක් පෞද්ගලික මට්ටමින් කිසිවෙකුට හිමි නොවේ. ඉමාම්වරුන් හා අනිකුත් විද්වතුන් යමකිසි විෂයක්

සම්බන්ධව විවිධ අදහස් හා මත ඉදිරි පත් කරන කල්හි ඒ සඳහා නිසි විසඳුමක් අල්කුර්ආන් හා අස්සුන්නාහ් යටතේ ලබා ගැනීම අවශ්‍යවේ. එමෙන්ම සත්‍ය සොයා දැනගැනීමේ (පර්යේෂන) මෙහෙයක උත්සක වෙමින් සිටින කෙනෙකුට එම මෙහෙයේදී අත්වැරද්දක් සිදුවූ කල ඒ සඳහා සමාවක් ඇත. මෙම න්‍යාය යටතේ කෙනෙකු සිය පර්යේෂණයක අවසානයේදී වැරදීමකින් හරියැයි සිතා වැරදි අදහසක් ඉදිරිපත් කරන්නේ නම් ඔහු වරදක් සිදුකල කෙනෙකු ලෙස පිළිගනු නොලැබේ.

9) (උම්මත්) සමාජය තුල දේව ආශිර්වාද (ප්‍රාතිහාර්යයන්) හා මගපෙන්වීම් ලැබූ විද්වතුන් බිහිවීමට පුළුවන. උමර් (රලි) තුමාට හිමිවූ දේවාශිර්වාදයන් මේ සඳහා කදිම නිදසුනකි. යහපත් සිහින සත්‍යවාදීවේ. එය නබිත්වයේ එක් අංගයක්ද වේ. මුහුණුවර හා දේහලක්ෂණ විපරම්කර කෙනෙකුගේ ගතිගුණ ගැන තීරණය කල හැක. නමුත් මෙම විනිශ්චය ශරීආවට අනුකූලනම් පමණක් මෙම සිදුවීම් කරාමත් හෙවත් දේවාශිර්වාදයක් හා මුබශ්ශරාත් හෙවත් සුභාසිංශනයක් ලෙස හඳුන්වමු. නමුත් මේවා පාදක කරගෙන ඉස්ලාමීය විශ්වාස පද්ධතියට හා ශරීආ නීති රීති වලට සාදකයක් ලෙස පිළිගැනීමට නොහැක.

10) ඉස්ලාමීය කටයුතුවලදී (මූනිච්චාව) නියම හැඟීම් සඟවා ව්‍යාජ ලෙස හැසිරීම අසික්ෂිත ක්‍රියාවකි. විචාරාත්මක ලෙස හා සංවාදශීලී ලෙස පවත්වනු ලබන විවාද පිළිගනු ලැබේ. ඉස්ලාමීය විෂයන් අතරින් ගැඹුරින් සොයා බැලීම් නොකළ යුතු යැයි වළක්වා ඇති (අභිධර්ම) විෂයන් සම්බන්ධව පර්යේෂන නොකිරීමෙන් වැළකී සිටීම අනිවාර්ය වේ. මුස්ලිම් කෙනෙකු තමන් නොදන්නා ගැඹුරු විෂයන් සම්බන්දව අවධානය යොමු නොකිරීමත් එම විෂයන් සම්බන්ධව පැහැදිලි දැනුම ඇත්තේ අල්ලාහ්ට පමණක්ය යනුවෙන් විශ්වාස කිරීමත් අනිවාර්යවේ.

11) යම් කිසි කරුණක් සම්බන්ධව විශ්වාසය කිරීමේදී වහී (දේවහෙළිදරව්ව) තුලින් ලැබුණු අදහස පමණක් මුල්කරගෙන පිළිගැනීම අනිවාර්ය වන අතර යම් කිසි කරුණක් ප්‍රතික්ෂේප කිරීමේදීද වහී මගින් ලැබුණු අදහස් පමණක් මුල් කරගෙන ඒවා ප්‍රතික්ෂේප කළ යුතුයි. තවද (බිද්අත්) නවීන අදහසක් හෙළා දැකීමේ අදහසින් වෙනත් බිද්අතයක් පිළිගැනීම නොකළ යුතුයි. එමෙන්ම උදාසීනව කටයුතු කිරීම තුලින් අන්තවාදී ක්‍රියා මර්ධනය කිරීමට හෝ අන්තවාදී ලෙස කටයුතු කිරීම තුලින් නීති විරෝදී (උදාසීන) ක්‍රියා මර්ධනය කිරීමටද උත්සාහ නොකළ යුතුයි.

12) ඉස්ලාම් ධර්මයට අදාල නොවූ අළුතින් හඳුන්වා දෙන ලද සියළු දේ (බිද්අත්) නවීනයන්වේ. සියළුම

බිද්අතයන් මංමුළාවන්වේ. සියළු මුලාවන් නිරයේ වේදනාව අත්පත් කර දෙන මාර්ගය වේ.

## දෙවෙනි කොටස

### 1 තව්හීද් පිළිබඳ බුද්ධිමය විශ්වාසය

අල්ලාහ් තආලා විසින් ඔහුට ආවේනිකවූ (අස්මාඋ) අලංකාර නාමයන් යනුවෙන් හා (සිෆාත්) ගුණාංගයන් යනුවෙන් සඳහන් කල දේ හා ඔහුගේ රසූල් (මුහම්මද් නබි තුමාණන් ) අල්ලාහ්ට ආවේනිකවූ අලංකාර නාමයන් හා ගුණාංග යනුවෙන් සඳහන් කල දේ වෙනත් වස්තුවකට හෝ දෙයකට තම්සීල් හෙවත් උපමා කිරීමකින් හෝ තක්යීෆ් හෙවත් සිතුවමකට හසු කිරීමකින් තොරව විශ්වාස කිරීම අනිවාර්ය වේ. තවද අල්ලාහ්ට අදාල නැති ගුණාංග යැයි අල්ලාහ් තආලා හා අල්ලාහ්ගේ රසූල් පැවැසූ දේ වංචනිකලෙස වෙනස්කිරීම, පිළිගැනීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම යනාදියෙන් වැළැකී අල්ලාහ්ට උචිත සුදුසු ගුණාංගයන් පමණක් පිළිගෙන විශ්වාස කිරීම අනිවාර්ය වේ. මෙසේ ඉහත සඳහන් කරුණු තහවුරු කරන "ඔහුට සමාන කිසිවක් නැත ඔහු සියල්ල අසයි ඔහු සියල්ල දකී" යන අල් කුර්ආන් වැකිය සාධකයක් වශයෙන් පිළිගැනීම අවශ්‍ය වේ. එපමණක් නොව මෙම

කරුණු සම්බන්ධව අල් කුර්ආනයේ සහ අල් හදීසයේ අන්තර්ගතවී ඇති වචනවල නියම අර්ථය සහ එහි අදහස නිසියාකාරව අවබෝධ කර ගැනීම කෙරෙහිද අවධානය යොමුකල යුතුයි.

2) කෙනෙකු අල්ලාහ් තආලාගේ (අල් අස්මා) අලංකාර නාමයන් හා ඔහුගේ (සිෆාත්) ගුණාංග යනාදිය (තම්සීල්හෙවත්) තවත් දෙයකට උපමා කිරීමේ හේතුවෙන් හෝ (තඃතීල් හෙවත්) පිළිගැනීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමෙන් (කුෆ්ර් හෙවත්) ඒක දේවත්වය ප්‍රතික්ෂේප කිරීමේ වරදට ලක්වෙයි. අහ්ලුල් බිද්ආවරුන් විසින් අල්ලාහ් තආලාගේ ගුණාංග හා අලංකාර නාමයන් සඳහා අර්ථ විවරනය කිරීමේ මුවාවෙන් කරනු ලබන වරදවා විස්තර කිරීම වනාහි විටෙක එය (කුෆ්ර් හෙවත්) දේවත්වය ප්‍රතිකෙෂ්ප කිරීමට අදාල විය හැක. එයට නිදසුනක් වන්නේ බාතිනියියාවරුන්ගේ අර්ථ විවරනයයි තවත් විටෙක එය නොමග යැවෙන (බිද්අත්) නූතන ක්‍රියාවන් ගොනුවටදඅදාලවිය හැක. අල්ලාහ් තආලාගේ ගුණාංගයන් ප්‍රතිකෙෂ්ප කරන්නන් විසින් එම ගුණාංගයන්ට කරන නොසුදුසු අර්ථ විවරණය එයට අදාහරනයකි. එමෙන්ම මෙම කොටස් දෙකට අදාල නොවුවදඒවා වැරදි අදහස් යැයි ස්ථිරවූ කොටසක්ද තඃරීෆ් වර්ග අතර තිබේ.

3) **<u>වහ්දතුල් වුජූද් පිළිබඳ විශ්වාසය</u>**

අල්ලාහ් ඔහු විසින් මැවූ වස්තූන් අතුරින් යම් කිසි වස්තුවක් මත පිවිසී සිටින බවට හෝ යම් කිසි

වස්තුවක් තුල එකිනෙකට මුසුවී සිටින බවට ඇතිකර ගන්නා විශ්වාසය කෙනෙකුව ඉස්ලාමීය රාමුව තුලින් ඉවත් කරනු ලබන කුෆ්ර් හෙවත් ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රියාවකි.

4) ගෞරවනීය මලාඉකාවරුන් පිළිබඳ පොදුවේ විශ්වාස කිරීම අනිවාර්යවේ. තවද ඔවුන්ගේ නම්, (ගතිලක්ෂණ) ගුණාංග හා ක්‍රියා රටාව යනාදිය පිළිබඳ විස්තරාත්මකව විකාශනයවී ඇති නිවැරදි ප්‍රාවෘත්ත මුල් කරගෙන (සවිස්තරව) පැහැදිලිව විශ්වාස කිරීම අනිවාර්ය වේ.

5) අල්ලාහ්තආලා විසින් පහළ කරන ලද සියළු දේව හෙළිදරව් (ආගම්) ගැන විශ්වාස කිරීම අනිවාර්යවේ. ඒවා අතරින් අල් කුර්ආනය ශ්‍රේෂ්ඨවූ ග්‍රන්ථයකි. අල් කුර්ආනය පහළවීමත් සමගම අනිකුත් ආගම් අවලංගු විය. ඒවා සංශෝදනයට ලක්වී ඇති බැවින් ඒවා අනුගමනය කිරීමටද නොහැක. එබැවින් අනිකුත් ආගම් හැර අල් කුර්ආනය පමණක් අනුගමනය කිරීම කෙරෙහි විශ්වාසය පිහිටුවීම අනිවාර්ය වේ.

6) අල්ලාහ් තආලාගේ නබිවරුන් හා රසූල්වරුන් (ඔවුන් සැමට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය හිමිවේවා) ගැන විශ්වාස කිරීම හා ඔවුහු අනිකුත් දනන්ට වඩා ශ්‍රේෂ්ඨ වූවන් බව පිළිගැනීමත් අනිවාර්ය වේ. නබිවරුන් ගැන හා රසූල්වරුන් ගැන මෙයට විරුද්ධ වූ අදහස් දරන කෙනෙකු කාෆිර්

හෙවත් ප්‍රතික්ෂේප කරන්නන්ගේ තත්ත්වයට පත්වනු ඇත. නබිවරුන් අතරින් සමහර නබිවරුන් ගැන විශේෂයෙන් සඳහන් වී ඇති කරුණු සියල්ල විශ්වාස කළයුතු අතර අනිකුත් නබිවරුන් ගැනද පොදුවේ විශ්වාස කිරීම අනිවාර්යවේ. මුහම්මද් නබි (සල්) තුමාණන් නබිවරුන් හා රසූල් වරුන් අතරින් ශ්‍රේෂ්ඨ හා උත්තරීතර කෙනෙකු වශයෙන්ද, නබි හා රසූල් පෙළපතේ අවසානයා වශයෙන්ද අල්ලාහ් තආලා විසින් මුහම්මද් නබි (සල්) තුමාණන්ව ලෝකවාසී සත්ත්වයාට පොදුවේ රසූල් කෙනෙකු වශයෙන් පහළ කළ බවද විශ්වාස කිරීම අනිවාර්යවේ.

7) මුහම්මද් නබි (සල්) තුමාණන්ගෙන් පසු අල්ලාහ් තආලාගේ මාර්ගයෙන් වහී (දේව හෙළිදරව්ව) පහළ නොවන බව හා එතුමා රසූල්වරුන් හා නබිවරුන් අතරින් අවසානයා බව විශ්වාස කිරීම අනිවාර්යවේ. කෙනෙකු මෙයට විරුද්ධව විශ්වාසයක් ඇති කර ගන්නේ නම් ඔහු කාෆිර් (ප්‍රතිකෙෂ්ප කරන්නෙකුගේ) තත්ත්වයට පත්වෙයි.

8) අවසාන දිනය ගැන හා එය ඇති වීමට පෙර දක්නට ලැබෙන (ලකෂණ) සළකුණු හා පෙරනිමිති පිළිබඳ සඳහන් වී ඇති විශ්වාසවන්තදායක විස්තර ගැන විශ්වාස කිරීම වාජිබ් (අනිවාර්ය) වේ.

9) **අල් කද්රි හයිරිහි වශර්රිහි මිනල්ලාහි** තආලා

අල්ලාහ් තආලාගේ පූර්ව සැළැස්ම ගැන විශ්වාස කිරීම හා කුසල් අකුසල් (හොඳ හෝ නොහොඳ) පිළිබඳ තීරණය අල්ලාහ් තආලා සතුය; යනුවෙන් විශ්වාස කිරීම අනිවාර්ය වේ. සිදුවීමට ඇති සියළුදේ සිදුවීමට පෙර ඒවා සිදුවෙන ආකාරය හා සිදුවෙන නියම වේලාව පිළිබඳ සම්පූර්ණ දැනුමක් ඇත්තේ අල්ලාහ්ට පමණක්ය; ඒ පිළිබඳ සියළු තොරතුරු ඔහු විසින් ලව්හුල් මහ්ෆූල් හෙවත් ආරක්ෂිත පුවරුවෙහි සටහන් කර ඇත. ඔහු විසින් සිදුවිය යුතුයැයි අදහස් කළදේ සිදුවිය. නොසිදු විය යුතු යැයි යනුවෙන් අදහස් කළ දේ නොසිදුවිය.ඔහු සිතූදේ හැර වෙන කිසිවක් සිදුනොවේ. අල්ලාහ් තආලා සියළු දේ කිරීම කෙරෙහි බලවතාය; ශක්තිවන්තයාය; ඔහු සියළු දේ නිර්මාණය කළේය; සිතූ පැතූ දේ කිරීම කෙරෙහි බලවතාය; යනුවෙන් විශ්වාස කිරීම අනිවාර්ය වේ.

10) අල්අර්ශ් වල්කුර්සියියු, ස්වර්ගය හා නිරය, කබ්ර් හෙවත් සොහොන් ජීවිතයේ සුවය සහ වේදනාව, සිරාත්, මීසාන්, යනාදී වශයෙන් අදෘශ්‍යමාන කරුණු පිළිබඳ සඳහන්වී ඇති සත්‍ය තොරතුරු අඩු කිරීමකින් හෝ වැඩි කිරීමකින් (වැරදි ලෙස විස්තර කිරීමකින්) තොරව විශ්වාස කිරීම අනිවාර්යවේ.

11) නබි (සල්) තුමාණන්ගේ ශෆාඅත් (කෙනෙකු වෙනුවෙන් මැදිහත් වීමේ සංකල්පය) ගැන හා අනිකුත් නබිවරුන්, මලාඉකාවරුන්, යහපත් ධාර්මික දනන් හා වෙනත් අයවලුන්ට කියාමත් දිනයේදී අනිකුත් ජනයා සඳහා ශෆාඅත් කිරීමට ඇති අයිතිය පිළිබඳ සඳහන් වී ඇති සත්‍ය තොරතුරු ගැන විශ්වාස කිරීම අනිවාර්ය වේ.

12) මුඃමීන්වරුන් හෙවත් විශ්වාසවන්තයින් හට අවසන් දිනයේදී ස්වර්ගයේදී හා මහ්ශර් දිනයේදී, සිය මැවුම් කරුවාවූ අල්ලාහ් තආලාව දැක බලා ගැනීමට හැක; යන සංකල්පය සත්‍යයැයි විශ්වාස කිරීම අනිවාර්ය වේ. මෙම සංකල්පය අවිශ්වාස කරන අය හා මෙම කරුණු සම්බන්ධව වෙනත් අදහස් දරන අය මංමුලාවූවන් සේ සළකනු ලැබේ. කිසිවෙකුට ඔහුගේ මැවුම් කරුවාවූ අල්ලාහ්තආලාව මෙලොවේදී දැක බලා ගැනීමට නොහැක.

13) අව්ලියාවරුන් හෙවත් දේවගැත්තන් හට හා යහපත් දනන් හට “කරාමත් හෙවත් අල්ලාහ් තආලාගේ ආශිර්වාදයක් වශයෙන් ප්‍රාතිහාර්යන් සිදුවන බව විශ්වාස කිරීම අවශ්‍යවේ. අස්වභාවික ලෙස හෝ අසාමාන්‍ය ලෙස සිදුවන සියළු දේ කරාමත් ලෙස පිළිගැනීමට නොහැක. සමහර විට මෙම ක්‍රියා අල්ලාහ්ගේ අඬුවමට ලක්කරවන

ක්‍රියාවක් බවට පත්වීමටද ඉඩ ඇත. සමහර විට මෙය ශෙයිතාන්ගේ හා දුෂ්ඨයින්ගේ බලපෑම් නිසා සිදුවිය හැක. මෙම ක්‍රියා අල්කුර්ආනයට හා සුන්නාහ් සංකල්පයට පටහැනි නොවන්නේ නම් පමණක් මෙය සම්බන්ධව සළකා බැලීමට පුළුවන; පටහැනි නම් මෙය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අවශ්‍ය නොවේ.

14) සියළුම මුඃමීන්වරුන් අසීමිත කරුණාවන්තවූ අල්ලාහ් තආලාගේ අව්ලියාවරුන් හෙවත් දේව ගැත්තන් බවට විශ්වාස කළ යුතුයි. තවද සියළු මුඃමින්වරුන් ඔවුන්ගේ ඊමාන් තත්ත්වය අනුව ඔවුන් තුලද විලායත් හෙවත් උත්තරීතර තත්ත්වයන් දක්නට ලැබෙන බවටද විශ්වාසයක් පිහිටුවා ගත යුතුයි.

තෙවෙනි කොටස

## තව්හීදුල් - උලූහියියත්
## (අල්ලාහ්ට පමණක් වැඳුම් පිදුම් කිරීම පිළිබඳ විශ්වාසය)

1) අල්ලාහ් තආලා ස්වතන්ත්‍රවේ; ඒකීයවේ; ඔහුගේ (රුබූබිය්යත් ) මවා ආරක්‍ෂා කරන තත්ත්වය (උලූහියියත්) නැමදුම් වතාවත්වලට අදාල තත්ත්වය, (අස්මා) ඔහුගේ නම් සහ (සිෆාත්) ගුණාංග යනාදියෙහි ඔහුට සමාන කිසිම වස්තුවක් නැත.

ඔහු විශ්වයේ සියළුම වස්තූන් මවා පෝෂණය කර ආරක්ෂාකරයි. සියළු ආකාරයේ වැඳුම් පිදුම් සඳහා සුදුසු උරුමවූ එකම තැනැත්තා ඔහුම වේ.

2) අයැද සිටීම, සරණ පැතීම, උදව් පැතීම, භාරවීම, මාංශදානය දීම, පැවැරීම, භියබැති වීම, අපේක්ෂාකිරීම තැබීම, ආදර දයාව දැක්වීම, යනාදී සියළු ආකාරයේ වැඳුම් පිදුම් හා යාච්ඥාවන් අල්ලාහ් උදෙසා පමණක් ඉටුකළ යුතුවේ. ඉහත සඳහන් කරුණු අතරින් කිසිවක් අල්ලාහ් තආලා හැර වෙන කිසිවෙක් හෝ කිසිවක් සඳහා ඉටු කිරීම ෂිර්ක් හෙවත් අල්ලාහ්ගේ බලමහිමයට යම් කිසිවක් සමානකිරීමේ (කොටස් කරුවෙකු ඇති කිරීමේ) තත්ත්වයෙහිලා සලකනු ලැබේ. අල්ලාහ් තආලාට ඉතා සමීපවූවන් හැටියට සැලැකෙන මලාඉකාවරුන්, ඔහු විසින් පහළ කරන ලද නබිවරුන්, හා රසූල්වරුන් නැත්නම් යහපත් වූ සේවකයන්, එසේත් නැත්නම් වෙනත් ආකාරයකින් වැදගත් තත්ත්වයකට පත් වී සිටින්නන් යනාදි වශයෙන් කුමන හේතුවක් නිසා හෝ වේවා ඉහත සඳහන් යාච්ඥා මෙහෙයන් අල්ලාහ් හැර වෙන කිසි වෙකු උදෙසා ඉටු කරන්නේ නම් ඒවා ශිර්ක් හෙවත් අල්ලාහ්ගේ බලමහිමයට කොටස් කරුවෙකු ඇති කිරීමේ ක්‍රියාවක් බවට පත්වේ.

3) මිනිස් සත්ත්වයා අල්ලාහ් තආලා කෙරෙහි දක්වන ආදරය, භියබැතිකම, හා විශ්වාසය යනාදි කරුණු සියල්ල එකට මුල්කර ගෙන අල්ලාහ් තආලාට වන්දනාමානය කිරීම අවශ්‍යවේ. ඉහත දැක්වූ කරුණු අතුරින් සමහර කරුණු නිසා පමණක් ඔහුට වන්දනාමානය කිරීම මංමුලාවූ ක්‍රියාවක්වේ. මේ සම්බන්ධව සමහර අදහස් ඉස්ලාමීය විද්වතුන් විසින් මෙසේ ප්‍රකාශ කර ඇත. අල්ලාහ් තආලා කෙරෙහි දක්වන ආදරය නිසා පමණක් ඔහුට වන්දනාමානය කිරීම සින්දීක් හෙවත් දේව විශ්වාසයෙන් තොරවූවන්වේ. භිය බැතිකම නිසා පමණක් අල්ලාහ් තආලාව වන්දනාමානය කිරීම (හරූරි) හෙවත් ඊමාන් තත්ත්වයට අනුව මංමුලාවූ තත්ත්වයට පත්කරවන ක්‍රියාවක්වේ. විශ්වාසය හා අපේක්ෂාවන් යටතේ පමණක් අල්ලාහ් වන්දනාමානය කරන්නා "මුර්ජී" (ඊමාන් තත්ත්වය අනුව වැරදි මාර්ගයෙහි ගමන් කල) කෙනෙකුවේ.

4) අල්ලාහ් තආලාට සහ ඔහුගේ රසූල් තුමාණන්ට සම්පූර්ණයෙන්ම යටහත්භාවය දැක්වීම, අල්ලාහ්ගේ සහ ඔහුගේ රසූල්ගේ තීරණය විකසිතින් සම්පූර්ණයෙන්ම පිළිගැනීම, අල්ලාහ්ට හා ඔහුගේ රසූල්ට සම්පූර්ණයෙන් අවනත වීම, නීතිය සම්පාදනය කරන්නා ලෙස අල්ලාහ් තආලාව

පිළිගෙන විශ්වාස කිරීම,යනාදී ගුණාංග ඔහුව "රබ්බු" (මවා පෝෂනය කරන්නා ) සහ ඉලාහ් (වන්දනාමානය කිරීමට එකම සුදුස්සා) වශයෙන් ඊමාන් (විශ්වාස ) කිරීමේ විෂයට ඇතුලත් වේ. එබැවින් නීතිය සකස්කිරීම අණපැනවීම යන කරුණුවලදී අල්ලාහ්ට සමාන කිසිවෙකු නැත යනු ඉස්ලාමීය විශ්වාසයයි. අල්ලාහ් කිසිවිටක අනුමත නොකරන ආකාරයේ නීති සකස් කිරීම, අල්ලාහ්ගේ අණට විරුද්ධව ක්‍රියාකරන තාගූත් (නොහොත් අල්ලාහ්ගේ නීති රීති හා තීරණ අනුගමනය කිරීමකින් තොරව මිනිසා විසින් නිර්මාණය කරන ලද නීති රීතීන් අනුගමනය කරන්නන් ) ගෙන් නීතිය හා සාධාරනය ඉල්ලා සිටීම, මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ ජීවන ක්‍රමය හැර එයට ප්‍රතිවිරුද්ධවූ දේ අනුගමනය කිරීම, ෂරීඅතයේ ඇති දේ වෙනස් කිරීම, යනාදී ගති ලකෂණ කුෆ්ර් හෙවත් ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රියාවට අයත්වේ. තමන්ට ශරීඅත් රාමුවෙන් පිට කටයුතු කිරීමට අයිතියක් ඇත; යනුවෙන් අදහස් කරන්නා නිසකවම අල්ලාහ්ව ප්‍රතිසෙෂ්ප කරන කාෆිර් කෙනෙකුවේ.

5) ප්‍රශ්න හා ගැටළු තිරාකරනය කිරීම සඳහා අල්ලාහ්ගේ තීරණ හා විසඳුම්වලට ප්‍රතිවිරුද්ධ විසඳුම් ලබා දීම මහාපරිමාණයේ කුෆ්ර් හෙවත් ප්‍රත්ක්ෂේප කිරීමේ ක්‍රියාවක් වේ.සමහර විට පළමු පෙලේ කුෆ්ර්

ක්‍රියාවට පහළින් පවතින පරිහානියේ හා පිරිහීමේ තත්ත්වයටද මෙම ක්‍රියා බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇත. අල්ලාහ්ගේ ෂරීඅත් හෙවත් නීති පද්ධති නොවන වෙනත් නීති පද්ධතියක් අනුගමනය කිරීම හා එසේ අනුගමනය කිරීමට අයිතියක් ඇත; යනුවෙන් විශ්වාස කිරීම පළමු පෙළේ කුෆ්ර් (ප්‍රතික්ෂේප කිරීමේ) තත්ත්වයට අයත්වේ. සාමාන්‍යයෙන් (අල්ලාහ්ගේ ශරීඅතය අනුගමනය කරන කෙනෙකු විසින් ) නියමිත එක් විෂයක පමණක් තමන්ගේ හිතට වහල්වී අල්ලාහ්ගේ නීතියට පටහැනිව කටයුතු කරන්නේ නම් එය ප්‍රධාන පෙළේ කුෆ්ර් ක්‍රියාවක් ලෙස පිළිගනු නොලැබේ. නමුත් එය කුෆ්රු තත්ත්වයට පහළින් පවතින (දෙවෙනි තත්ත්වයේ) වැරදිසහගත ක්‍රියාවක්වේ.

6) වරප්‍රසාද ලත් පිරිසක් විසින් පමණක් අනුගමනය කල යුතුදේ යනුවෙන් හා පොදුජනයා විසින් අනුගමනය කල යුතු දේ යනුවෙන් ආගමේ ඉගැන්වීම් කොටස් වශයෙන් බෙදා වෙන්කිරීම, දේශපාලන ක්ෂේත්‍රය හා ඒ හා සමාන වෙනත් ක්ෂේත්‍ර ආගමික ඉගැන්වීම්වලින් වෙන්කිරීම මහා වරදක්වේ. ෂරීඅතයට ප්‍රතිවිරුද්ධව ඇතිවිය හැකි අදහස් හා ක්‍රියාරටා සියල්ලක්ම එහි (පවතින බැරෑරුම්) තත්ත්වය අනුව කුෆ්රු තත්ත්වයෙහිලා හෝ මංමුලාවූ තත්ත්වයෙහිලා සළකනු ලැබේ.

7) බුද්ධියට ග්‍රහනය කර ගැනීමට නොහැකි, එම ශක්තියෙන් ඔබ්බට විහිදී යන කරුණු ගැන (ස්වතන්ත්‍රවූ එකම) අල්ලාහ් හැර වෙනතත් කිසිවෙකු නොදනී. එවැනි අදෘශ්‍යමාන කරුණු පිළිබඳ අල්ලාහ් හැර වෙනත් අයටද දැනුමක් ඇත; යනුවෙන් විශ්වාස කිරීම කුෆ්ර්වේ. මේ හැරුණු විට අල්ලාහ් ඔහුගේ රසූල්වරුන් අතරින් සමහර අයට අදෘශ්‍යමාන දේ පිළිබඳ අවබෝධයක් ලබා දෙන බව විශ්වාස කිරීම අනිවාර්ය වේ.

8) දෛවඥයින් හා ශාස්ත්‍රඥයින් පවසන දේ සත්‍ය යයි විශ්වාස කිරීම කුෆ්ර් වේ. (පලාඵල ගැන විමසීම, හඳහන් බැලීම) හා ඔවුන් හමුවට යාම, මහාපාපී ක්‍රියාවක්වේ.

9) ඉස්ලාම් ධර්මය විසින් අනුමත කරන ලද වන්දනාමාන ක්‍රම හා වත්පිළිවෙත් තුලින් අල්ලාහ් තආලාට සමීපවීම සඳහා අල්ලාහ්ගෙන් පමණක් උදව් උපකාරය ලබා ගැනීමට උත්සක වීම අල් කුර්ආනයේ සඳහන්වී ඇති වසීලා හෙවත් උදව් උපකාර ලබා ගැනීමේ ක්‍රමයවේ.

වසීලා හෙවත් (අල්ලාහ්ට සමීපවීම සඳහා)
උදව්උපකාරය ඉල්ලාසිටීම ක්‍රම තුනකින් සමන්විතය

අ - අනුමත කරන ලද ක්‍රමය : අල්ලාහ් තආලාගේ අස්මා, (නම්) ඔහුගේ සිෆාත්, (ගුණාංග) යනාදිය මුල්කරගෙන හෝ ඉස්ලාම් ධර්මයේ අනුමත කරන ලද යහපත් ක්‍රියාවක් ඉටු කිරීම තුලින් අල්ලාහ් තආලාගෙන් උදව් උපකාර ඉල්ලා සිටීම. ජීවතුන් අතර සිටින යහපත් දනන්ගේ ප්‍රාර්ථනාවන් මුල් කරගෙන අල්ලාහ් තආලාගෙන් උදව් උපකාර ඉල්ලා සිටීම.

ආ) බිද්අත් (නූතන ක්‍රියා) :- ශරීඅතයේ අනුමත නොකරන ලද වසීලා ක්‍රම මෙම සනයට අයත්වේ. එනම් නබිවරුන් හෝ යහපත්, ගෞරවාන්විත, උත්තරීතර දනන්ගේ මාර්ගයෙන් හෝ ඔවුන්ගේ උත්තරීතරභාවය, ගෞරවාන්විත තත්ත්වය, හා වෙනත් ක්‍රම මුල්කරගෙන උදව් උපකාර ඉල්ලා සිටීම.

ඇ) ශිර්ක් : අභාවයට පත්වූවන්ව (ඉබාදත්) වන්දනාමාන ක්‍රියා වලියේදී මැදහත් කරුවන් ලෙස පිළිගැනීම, ඔවුන්ගෙන් ප්‍රාර්ථනා ඉල්ලා සිය අවශ්‍යතා ඉටුකර දෙන මෙන් අයද සිටීම, ඔවුන්ගේ මාර්ගයෙන් උදව් උපකාර ඉල්ලාසිටීම, වැනි ක්‍රියා ශිර්ක්වූ (අල්ලාහ්ගේ බලමහිමයට කිසිවක් සමාන කිරීමේ) වසීලා ක්‍රමයට අයත්වේ.

10) බරකත් හෙවත් ආශිර්වාදාත්මක පරිත්‍යාගය අල්ලාහ් තආලාගේ මාර්ගයෙන් පමණක් ලැබේ. එහෙත් ඔහු සිතූ පැතූ ආකාරයට ඔහුගේ කැමැත්ත අනුව ඒවා යම් කිසිවෙකුට ප්‍රධානය කරයි. එබැවින් අල්ලාහ්ගේ බරකත් හෙවත් පරිත්‍යාගය විශේෂ වරප්‍රසාදයක්සේ කෙනෙකුට හිමිවී ඇත; යනුවෙන් කිසිදු සාක්ෂියකින් තොරව විශ්වාස නොකල යුතුයි. බරකත් යන්නෙහි අර්ථය පුළුල්ය. නමුත් එහි සාමාන්‍යය අර්තය කෙනෙකුට සම්පත් හෝ ආශිර්වාද ලැබීම අධිකවීම හෝ ඒවා කෙනෙකුගේ ජීවිතය තුල නිරන්තරයෙන්ම ලැබීම හා පැවැතීම යන්නයි.

බරකත් හඳුනා ගත හැකි මාර්ග විවිධයි.එනම් කාලය තුලත් බරකත් අන්තර් ගතවී ඇත. ලෛලතුල් කද්ර් (රමළාන් මාසයේ එක්තරා විශිෂ්ඨ දිනයක්) මෙයට නිදසුනක්ය. විවිධ ස්ථානය තුලත් බරකත් අන්තර් ගතවී ඇත. ශුද්ධවූ කඃබතුල්ලාහ්, මස්ජිදුන් නබවී, මස්ජිදුල් අක්සා, යන මස්ජිද් තුන මෙයට නිදසුන් වේ. ද්‍රව්‍ය තුලත් බරකත් අන්තර් ගතවී ඇත. සම්සම් ජලය මෙයට උදාහරණයක් වේ. යහපත් ක්‍රියා රටාව තුලත් බරකත් අන්තර් ගතවී ඇත.යහපත් විශිෂ්ඨ කුසල් කර්මයන් මෙයට නිදසුනක් වේ. මිනිසුන් අතරද බරකත් ඇති දනන්

සිටිති. නබිවරුන් මෙයට කදිම නිදසුනක් ලෙස පිළිගැනීමට හැක. පොදුවේ මිනිසුන් හා ඔවුන්ගේ ශරීරයේ ඇති විවිධ අංග තුලින් හා ඔවුන්ගේ උසස් තත්ත්වය මුල් කර ගෙන බරකත් ලබා ගැනීමට නොහැක. නමුත් මිනිසුන් අතර මුහම්මද් නබි (සල්) තුමාණන් හා එතුමාගේ ශරීරයෙන් උණන කෙල, දහදිය, හා හිසකෙස් යනාදිය තුලින් පමණක් බරකත් ලබා ගැනීමට අනුමත කර ඇත. නමුත් එතුමාගේ වියෝවත් සමගම මෙසේ එතුමා තුලින් හා එතුමාගේ ශරීරයට සම්බන්ධ ඉහත සඳහන් කරුනු තුලින් බරකත් ලබා ගැනීමේ ක්‍රමයද අහෝසි විය.

11) ඉස්ලාම් ධර්මයේ අනුමත කරන ලද ක්‍රම තුලින් පමණක් බරකත් අයද සිටීම අනිවාර්යවේ. වෙනත් තහනම් කරන ලද මාර්ග තුලින් බරකත් අයද සිටීමෙන් වැළකී සිටිය යුතුයි.

12) මුස්ලිම්වරුන්ගේ සුසාන භූමිය කරා ගොස් එහි ඇති (කබ්ර්) සොහොන් බැහැදැකීමේදී මිනිසුන්ගේ ආකල්ප ක්‍රම තුනකින් සමන්විතය

1 ඉස්ලාම් ධර්මයේ අනුමත කරන ලද ක්‍රමය:
මරණින් මතු ජීවිතය පිළිබඳ හැඟීමක් සිත් සතන් තුල ඇති කර ගැනීම, මිහිදන් කරනු ලැබූ අයවලුන්ට සලාම් කීමට සහ ඔවුන් සඳහා අල්ලාහ්

තආලාගෙන් ප්‍රාර්ථනා කිරීම, යනාදි චේතනා පමණක් මුල් කරගෙන සුසාන භූමිය කරා ගමන් කිරීම මෙම ක්‍රමයට අයත්වේ.

11 තව්හීද් සංකල්පයේ පරිපූර්ණත්වයට පටහැනිවූ (බිද්අත් ) ක්‍රමයඃ මෙය ශිර්ක් හෙවත් අල්ලාහ්ට යමක් ආදේශ කිරීමේ වරදට හසුකිරීමට දායකවන මාර්ග අතුරින් එකකි.
කබ්ර් (සොහොන්) ස්ථාන වැදගත් ස්ථානයක් යැයි සිතා එහි ගොස් අල්ලාහ්තආලාව වන්දනාමානය කිරීමට හා ඔහුට සමීපවීමට උත්සාහ කිරීම, කබ්ර් (සොහොන්) තුලින් බරකත් ලබා ගැනීමට උත්සාහ කිරීම, එම ස්ථානයේ නොයෙකුත් පුද පූජා පැවැත්වීම්, සොහොන් මතුපිට ස්මාරක වැනි දේ ඉදිකිරීම, පහන් තැබීම, එහි මත හුණු හෝ සායම් වැනිදේ ගෑම, කබ්ර් ස්ථාන මස්ජිද් ලෙස භාවිතා කිරීම, එම ස්ථාන කරා ගමන් බිමන් වල යෙදීම, වැනි ඉස්ලාම් ධර්මයේ තහනම් කරඇති දෑ සහ ඉස්ලාම් ධර්මයේ සඳහන් නොවූ සියළුම ක්‍රම ඉස්ලාම් ධර්මයට පටහැනි බිද්අත් ක්‍රම වේ.

111 - තව්හීද් (ඒකදේවවාදී) ක්‍රමයට පටහැනි ශිර්ක් හෙවත් අල්ලාහ්ට කොටස් කරුවෙකු ඇති කිරීමේ ක්‍රමය :

වන්දනා මාන ක්‍රම අතරින් යම්කිසිවක් භූමදාන කරනු ලැබූ අය උදෙසා ඉටු කිරීම, සිය අවශ්‍යතාවයන් සඳහා අල්ලාහ් තආලාගෙන් අයද සිටීම වෙනුවට මළවුවන් ගෙන් අයද සිටීම, අල්ලාහ් තආලාගෙන් උදව් උපකාර හා ආරක්ෂාව ඉල්ලා සිටීම වෙනුවට මළවුවන් ගෙන් ඉල්ලා සිටීම, ආරක්ෂාව පතා කන්නලව් කිරීම, තවාෆ් ක්‍රමය අනුකරනය කරමින් එම ස්ථාන වටා ගමන් කිරීම, මළවුවන් වෙනුවෙන් මාංශ දානය දීම, මළවුවන්ගේ නාමයෙන් භාර වීම, යනාදී සියළු ක්‍රියා ශිර්ක් හෙවත් අල්ලාහ්ගේ බලයට යමක් සමාන කිරීමේ ක්‍රමයට අයත්වේ.

13) (පොදු න්‍යායක් අනුව) එක්තරා අධිෂ්ඨානයක් කරා ගමන් කිරීම සඳහා යොදවාගනු ලබන අතුරු මාර්ගද එම අධිෂ්ඨානය කරා ප්‍රවිෂ්ඨ වීමේ රුකුලක් සහ අනුබලයක් සේ සලකනු ලබයි. එබැවින් අල්ලාහ්ට වන්දනා මාන කිරීමේ ක්‍රමය තුල ශිර්ක් හෙවත් අල්ලාහ්ගේ බලමහිමයට කොටස් කරුවන් ඇතිකිරීමේ සියළු ක්‍රියා සහ බිද්අත් හෙවත් ඉස්ලාමීය ඉගැන්වීම් තුල නැති දේ ඇති කරවන නූතන ක්‍රියා සියල්ලක්ම ඉස්ලාමයට ප්‍රතිවිරුද්ධවූ දේ හැටියට සලකා ඒවා ඉස්ලාමය තුලට ඇතුල් නොවන ආකාරයට මර්ධනය කිරීම අවශ්‍යවේ. මන්ද

ඉස්ලාමයේ නැති අළුතින් ඇතිකරවන සියළු දේ බිද්අත් වේ. සියළුම නූතන ක්‍රියා මං මුලාවක්වේ.

## සිව්වෙනි කොටස
## ඊමාන් (විශ්වාසය)

1) ඊමාන් යන වචනයෙහි අර්ථය සත්‍ය ලෙස පිළිගැනීම යන්නයි. ශරීආ ව්‍යවහාරයට අනුව ඊමාන් යනු වචනයට හා ක්‍රියාවට අදාල කරුණක් වන්නේය, එහි තත්ත්වය අඩු වැඩිවේ.

එබැවින් ඊමාන් යනු සිත් සතන් තුලින් (පිළිගෙන) මුවින් උච්චාරනය කිරීමයි. තවද සිත්සතන්තුලින්, වචනයෙන්,හා ශරීරයේ අවයවයන් මාර්ගයෙන් ඊමාන්හි තත්ත්වය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමදවේ.

සිත් සතන් තුලින් ප්‍රකාශ කිරීම යනු ඊමාන් (විශ්වාස) කල යුතු දේ සත්‍යය යැයි පිළිගෙන විශ්වාස කිරීමයි. මුවින් ප්‍රකාශ කිරීම යනු සිත් සතන් තුලින් විශ්වාස කලදේ මුවින් ප්‍රකාශ කිරීමයි. සිත්සතන් තුලින් ක්‍රියාත්මක කිරීම යනු සිතෙන් පිළිගැනීම, සිතෙහි පවිත්‍ර චේතනාවක් ඇති කිරීම, යටහත් භාවය දැක්වීම, ඒ කෙරෙහි ලැදියාවක් ඇති

කරගැනීම හා භියබැතිව කුසල් ක්‍රියා කිරීමට පෙළඹීමයි. පංචේන්ද්‍රයන් තුලින් ක්‍රියාත්මක කිරීම යනු ඉස්ලාම් ධර්මය විසින් අණ කරන ලද දේ අනුගමනය කිරීම හා තහනම් කල දෙයින් වැලැකී සිටීමයි.

2) ඊමානය යන විශ්වාසයට ක්‍රියාව අදාල නොවෙයි යැයි පවසා එය විශ්වායෙන් (ඊමානයෙන්) බැහැර කරන්නා මුර්ජිවරුන් (ඊමාන්හි තත්ත්වයට අනුව වැරැදි මාර්ගයෙහි ගමන් කරන්නන්) ගේ තත්ත්වයට පත්වෙනු ඇත. ක්‍රියාවන් අතරින් ඉස්ලාමීය ඉගැන්වීම්වලට අදාල නැති අළුතින් හඳුන්වා දෙන ලද දේ ඉස්ලාමීය රාමුව තුලට ඇතුලත් කරන්නන් මුබ්තදිඊන් හෙවත් නොමග ගියවුන්සේ සළකනු ලැබේ.

3) “වන්දනාමානය කිරීමට සුදුස්සා අල්ලාහ් තආලා හැර වෙනත් කිසිදු ඉලාහ් කෙනෙක් නැත. මුහම්මද් නබි (සල්) තුමාණන් අල්ලාහ් තආලාගේ වක්තෘවරයාය” යන සාක්ෂි දැරීමේ මෙම ප්‍රකාශය පිළිනොගත් තැනැත්තා විශ්වාස වන්තයෙකු ලෙස පිළිගනු නොලැබේ. විශ්වාස වන්තයකුට හිමි ආනිසංසය හෝ නීති රීති මෙලොවේදී හෝ එලොව ජීවිතයේදී ඔහුට අදාලවන්නේ නැත.

4) ඉස්ලාම්, ඊමාන් යන යෙදුම් ශරීආ ව්‍යවහාරයට අදාල වචන දෙකකි. මෙහි අර්ථය එකිනෙක සමානවේ. සමහර අවස්ථාවන්හිදී එකිනෙක වෙනස්වේ. උදා: සියළුම මුඃමින්වරුන් මුස්ලිම් වරුන් වේ. නමුත් සියළු මුස්ලිම්වරුන් මුඃමින්වරුන් ලෙස පිළිගනු නොලැබේ. කිබ්ලාව දෙසට හැරී සලාත් ඉටු කරන සියළුදෙනා මුස්ලිම්වරුන් ලෙස හඳුන්වමු.

5) කුෆ්ර් (ප්‍රතික්ෂේප කිරීම්) ශිර්ක් (සමාන කිරීම්) හැර වෙනත් මහා පාපී ක්‍රියාවන්වල යෙදෙන්නා ඊමාන් (විශ්වාසය) නැති අයකු ලෙස නොව ඊමාන් තත්ත්වයෙහි (ඌනතාවයක්) අඩුවක් ඇති විශ්වාසවන්ත පුද්ගලයෙකුසේ සැලැකිය යුතුය. අවසන් දිනයේදී ඔහුට අදාල තීන්දුව අල්ලාහ්ගේ කැමැත්ත අනුව සිදුවේ. ඔහුගේ කැමැත්ත අනුව සමාව දෙනු ලැබේ. නැත්නම් වේදනාවට ලක් කරනු ලැබේ. තව්හීද් හෙවත් ඒකදේවවාදය පිළිගත් සියළු දෙනා අවසානයේදී ස්වර්ගයට ඇතුලත් වෙති. ඔවුන් අතරින් සමහර අයවලුන් නිරයට ඇතුලත් කර වේදනාවට ලක් කරනු ලැබුවද තව්හීදය පිළිගත් හේතුව නිසා එහි සදා කාලිනව නොරැඳී සිටිති.

6) මුස්ලිම්වරුන් අතරින් අසවල් තැනැත්තා ස්වර්ගයට අයත් කෙනෙකු වශයෙන් හෝ නිරයට අයත් කෙනෙකු වශයෙන් අල්ලාහ් විසින් හෝ

ඔහුගේ රසූල් විසින් පැහැදිලිව සඳහන් කළ අයවලුන් හැර වෙනත් කිසිවෙකු ස්වර්ගයට අයත් කෙනෙකු ලෙස හෝ නිරයට අයත් කෙනෙකු ලෙස කිසිවෙකුට තීරණය කිරීමට නොහැක.

7) ශරීඅත් අනුව කුෆ්ර් සංකල්පය කොටස් දෙකකින් සමන්විතය. 1- කෙනෙකුව ඉස්ලාමයෙන් සම්පූර්ණයෙන් ඉවත් කරවනු ලබන මහා පරිමානයේ කුෆ්ර් ක්‍රියාව 2- කෙනෙකුව ඉස්ලාමයෙන් සම්පූර්ණයෙන් ඉවත් නොකරන සුළු පරිමානයේ කුෆ්ර් ක්‍රියාව. දෙවනුව සඳහන් කල කුෆ්ර් වර්ගය කෙනෙකුගේ (ක්‍රියාවට) හැසිරීමට සම්බන්ධ කුෆ්ර් යනුවෙන්ද හඳුන්වනු ලැබේ.

8) කෙනෙකුව කාෆිර් යනුවෙන් තීරණය කරන්නේ නම් අල් කුර්ආන් සුන්නාහ් යන මූල ධර්ම දෙක මුල් කරගෙන පමණක් එසේ තීරණය කළයුතුයි. ඉස්ලාමීය සාධක ඉදිරිපත් කිරීමකින් තොරව මුස්ලිම්වරයකුගේ කථා හා ක්‍රියා මුල් කරගෙන පමණක් ඔහුව කාෆිර් වශයෙන් තීරණය කිරීම වැරදි සහගත විනිශ්චයකි. කෙනෙකුව කාෆිර් යනුවෙන් තීරණය කිරීමට අවශ්‍ය කොන්දේසි දක්නට ලැබුනු විටක හා මේ සම්බන්ධයෙන් ඔහුගේ නිර්දෝශී බව ඔප්පු කිරීමට අදාල කරුණු නැති විටක පමණක් ඔහු කාෆිර් යනුවෙන් තීරණය කිරීමට හැක.

කෙනෙකුව කාෆිර් යනුවෙන් තීරණය කිරීම ඉතා භයානක විනිශ්චයකි. මේ සඳහා නිවැරදි සාක්ෂි සහ සාධක අවශ්‍ය වේ. එබැවින් මුස්ලිම් කෙනෙකුව කාෆිර් යනුවෙන් පැවැසීම සම්බන්ධයෙන් ඉතා ප්‍රවේසමින්, කල්පනා කාරීව, වගකීමකින් යුක්තව කටයුතු කිරීම අනිවාර්ය වේ.

## පස්වෙනි කොටස

## අල්- කුර්ආන් සහ ප්‍රකාශය

1) ( අක්ෂර මාලාවන්, වචන හා අර්ථයන්ගෙන් සමන්විත) අල් කුර්ආනය අල්ලාහ් තආලාගේ (කලාම්) ප්‍රකාශය අන්තර් ගතවූ ග්‍රන්ථය වේ. එය අල්ලාහ් තආලා විසින් හෙළිදරව් කරන ලදි.එය නිර්මානය කරන ලද්දක් නොවේ. (ඒවා වියකී විනාශ වී නොයනු ඇත.) එය ඔහු විසින් එවන ලද අතර ආපසු ඔහු වෙතටම යනු ඇත. අල් කුර්ආනය මුහම්මද් නබි (සල්) තුමා වෙත පහළ කිරීමත් සමගම එය එතුමාගේ ධර්ම දූත මෙහෙයද තහවුරු කරන ප්‍රාතිහාර්යාත්මක සාධකයක් බවට පත්විය. මෙලොව අවසන් දිනය දක්වා කිසිදු වෙනස් වීමකින් තොරව අල්ලාහ් තආලා විසින් එහි පාරිශුද්ධත්වය ආරක්ෂා කරනු ඇත.

2) **"අල්ලාහ් තආලා කතා කරයි"** මෙහි අර්ථය නම් අල්ලාහ් ඔහුට කැමැති වේලාවක කැමැති ආකාරයට ඔහු සිතනදේ සම්බන්ධව කථා කරයි යන්නයි. අල්ලාහ් විසින් කථා කිරීම පිළිබඳ පුවත සත්‍යවේ. ඔහුගේ කථා විලාසය අක්ෂර විකාශනයකින් හෝ ශබ්ද විකාශනයකින් සමන්විතවේ. එය කුමන ආකාරයක ස්වාභාවයක් ගනීද යන්න පිළිබඳ අර්ථ විවරණය කිරීමට නොහැක. ඒ ගැන පරීක්ෂා කිරීම අවශ්‍ය නොවනු ඇත.

3) අල්ලාහ්ගේ කලාම් යනු "මඃනා නෆ්සී "වචනයකින් තොර එක්තරා අර්ථයකි, මෙය ප්‍රරාවෘත්තයකි, එහි වදන් මාලාවකි, උපමාවකි, කාල්පනික අදහසකි, යනාදි වශයෙන් හෝ මෙයට සමානව නිර්වචනය කිරීම මංමුලාවූ ක්‍රියාවක්වේ. තවද අල් කුර්ආනය නිර්මාණය කරන ලද්දක් බව පැවැසීම තුලින්ද කුෆ්රය ඇති කරවයි.

4) අල්කුර්ආනයේ සඳහන් කිසිවක් පිළිගැනීම ප්‍රතික්ෂේප කරන්නා හා එහි ඌණතා හා අඩු වැඩිවීම් සිදුවී ඇති බවට හා එහි වැරදි අර්ථකථන අන්තර් ගතවී ඇතිබවට වාද විවාද කරන්නා කාෆිර් කෙනෙකුවේ.

5) පැරන්නන් අනුගමනය කළ මාර්ගය තුළින්ම අල්කුර්ආනය අවබෝධ කර ගැනීම හා අර්ථ විවරණය කිරීම අනිවාර්ය වේ. සිය බුද්ධිය පමණක් මුල්කර ගෙන අල්-කුර්ආනය හැදෑරීමෙන් වැළැකී සිටිය යුතුය. කුමක් නිසාද යත් සිය බුද්ධි මට්ටම උපයෝගී කරගෙන අල්කුර්ආනය අර්ථ විවරණය කිරීමෙන් අල්ලාහ්ගේ අදහසට විරුද්ධවූ අදහස් ඔහුගේ මුවින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. බාතිනියියා වරුන්ගේ මාර්ගයෙන් හා ඒ හා සමාන මාර්ගයෙන් අල්-කුර්ආනයට අර්ථ විවරණ ලබාදීම කුෆ්ර් ක්‍රියාවකි.

## හයවෙනි කොටස

## අල්- කද්ර්(අල්ලාහ්ගේ පූර්ව සැළැස්ම)

1) අල් කද්ර් හෙවත් අල්ලාහ්ගේ පූර්ව සැළැස්ම පිළිබඳව හා හොඳ හා නරක පිළිබඳ තීරණය කිරීමේ අයිතිය හා බලය ඇත්තේ අල්ලාහ්ට පමණක් බව විශ්වාස කිරීම ඊමාන් විශ්වාසයේ ප්‍රධාන කොටසකි. මේවා පහත සඳහන් ආකාරයට ගොනු කිරීමට හැක.

අල්කද්ර් පිළිබඳ හා ඒ හා සම්බන්ධ කරුණු වූ දැනුම, ලේඛණ ගත කිරීම, කැමැත්ත ක්‍රියාත්මක කිරීම,නිර්මානය කිරීම, යනාදිය පිළිබඳ සඳහන් වී ඇති සියළුම අල් කුර්ආනීය වදන් ගැන (ඊමාන්)

විශ්වාස කිරීම හා අල්ලාහ් තආලාගේ තීරණය කිසිවෙකුට වෙනස් කිරීමට නොහැක; එසේම ඔහුගේ අණට කිසිවෙකුට විරුද්ධ වීමටද නොහැක. යනුවෙන් විශ්වාස කිරීමද අනිවාර්ය වේ.

2) අල්ලාහ්ගේ ඉරාදත් (නියමයන්) ඔහුගේ අම්ර් (අණ) යනුවෙන් අල්-කුර්ආනයේ සහ අල්හදීස්හි සඳහන් කරුණු කොටස් දෙකකට බෙදිය හැක.එනම්

(අ) සියළු වස්තූන් නිර්මාණය කිරීම පිළිබඳ අල්ලාහ් තආලා ගේ කැමැත්ත හෝ එසේ නිර්මානය කිරීම පිළිබඳ ඔහුගේ තීරණය

ආ) ඔහුගේ තීරණය අනුව ශරීආ (නීති ක්ෂේත්‍රය) වශයෙන් පවතින කැමැත්ත හෝ ඔහුගේ නීති රීති පිළිබඳ විදානය හා පරමාධිපත්‍යය යනාදි වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

මිනිස් සත්ත්වයාටද යම්කිසි කරුණක් ගැන සිතීමට හා ඒවා ක්‍රියාවට නැංවීමට හැක; නමුත් ඒ සියල්ලක්ම අල්ලාහ්ගේ කැමැත්ත හා ඔහුගේ තීරණය අනුව සිදුවේ.

3) මිනිස් සත්ත්වයා සුමඟ යැවීම හා නොමඟ යැවීම අල්ලාහ් තආලා සතු වගකීමක් වේ. එබැවින් ඔහුගේ කාරුණික භාවය නිසා කෙනෙකුව සුමඟ යැවීමට හැක. තවද නීතිය සර්ව සාධාරන ලෙස ක්‍රියාත්මක කිරීම තුලින් කෙනෙකුව නොමඟ යැවීමටද හැක.

4) මිනිස් සත්ත්වයා නිර්මාණය කිරීම, ඔහුගේ ක්‍රියා රටාව හසුර වීම, අල්ලාහ් සතු නිර්මානය කිරීමේ බලයට අයත් වේ. අල්ලාහ් තආලා හැර මිනිසාගේ ක්‍රියා රටාව නිර්මානය කරන හා හසුරුවන වෙන කිසිවෙකු නැත. එබැවින් මිනිස් සත්ත්වයාගේ ක්‍රියාව අල්ලාහ් විසින් නිර්මාණය කරනු ලබන අතර ඔවුහු ප්‍රායෝගිකව ක්‍රියාවෙහි නියලෙති.

5) අල්ලාහ් තආලා විසින් ඇති කරවන සියළු ක්‍රියාවන් ප්‍රඥා ඥානයෙන් පිරී පවතින බව හා ඔහුගේ චේතනාව අනුව සියළු හේතු ඵල සිදුවන බව විශ්වාස කිරීම අනිවාර්ය වේ.

6) කිසිවෙකුගේ හෝ කිසිවකගේ “අජල්”හෙවත් ආයුශ කාල සීමාව අල්ලාහ් තආලා විසින් තීරණය (ලේඛන ගත) කර ඇත. සියළු දෙනාටම හිමි ආහාර පාන හා වෙනත් වරප්‍රසාද අල්ලාහ් තආලා විසින් පිරි නමනු ලැබ ඇත. සියළු දෙනාටම හිමි

**<u>සආදත්</u>** හෙවත් සෞභාග්‍යය හා **<u>ශකාවත්</u>** හෙවත් දුක්ඛිත තත්ත්වය අල්ලාහ් තආලා විසින් නියම කර ඇති බව හා සියළු සත්ත්වයන් නිර්මාණය කිරීමට පෙර ඒ හැමදෙනාටම හිමි තත්ත්වය අල්ලාහ් විසින් තීරණය කරනු ලැබ ඇත යනුවෙන් විශ්වාස කිරීමද අනිවාර්ය වේ.

7) දුක් කරදර ඇතිවූ මොහොතක අල්ලාහ්ගේ කැමැත්ත අනුව ඒ සියල්ලක්ම සිදු වන බවට හේතු දැක්වීම සාධාරන වුවද පාපි ක්‍රියාවන් හා වැරදි ක්‍රියාවන් සිදු කරන විටක ඒ සියල්ලක්ම අල්ලාහ් ගේ කැමැත්ත අනුව සිදුවන බවට චෝදනා නොකල යුතුය; එනමුත් (පාපි ක්‍රියාවන් හා වැරදි ක්‍රියාවන්වලින් වැළකී සිටීම හා) කල වරදට අල්ලාහ් තආලාගෙන් පාපෝච්චාරනය කර සමාව අයද සිටීම අනිවාර්ය වේ. පාපී හා වැරදි ක්‍රියා කරන්නන්හට අවවාද කිරීම හා දැනමුතු කම් කීම සැම දෙනා සතු වගකීමක් මෙන්ම යුතුකමක්ද වේ.

8) අල්ලාහ්ගේ කැමැත්ත අනුව සියල්ලක්ම සිදුවෙන බවට විශ්වාසයක් ඇති නොකර හේතු ඵල කෙරෙහි විශ්වාසය තබා සියල්ලක්ම ඒ මත සිදුවන බව විශ්වාස කිරීම තව්හීද් හෙවත් ඒකදේවවාදී සංකල්පයට පටහැනිවූ අල්ලාහ්ට ශිර්ක් කිරීමේ ක්‍රියාවක්වේ. ඉස්ලාමී සංකල්පය අනුව හේතුඵල සාධක සංකල්පය සහමුලින්ම ප්‍රතිකෙෂ්ප කිරීම

වැරැදි සහගත ආකල්පයකි. හේතුඵල සාධක මත සිදුවෙන ක්‍රියා නොසලකා හැරීම බුද්ධිමත් ක්‍රියාවක් හෝ ෂරීඅතයට අනුව සුදුසු ක්‍රියාවක්ද නොවේ. හේතුඵල සාධක සංකල්පය මත පිහිටා කටයුතු කිරීම "තවක්කුල්" හෙවත් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා සියළු කටයුතු ඔහු වෙත භාර කිරීමේ තත්ත්වයට පටහැනිවේ.

## හත් වෙනි කොටස
## ජමාඅත් සහ ඉමාමත්

1) මෙහි "ජමාඅත්" යනු මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ (සහාබාවරුන්) ශ්‍රාවක මිතුරන්, හා ඒ අයවලුන්ගේ මාර්ගයෙහි ගමන් කල තාබිර්න් වරුන්,(සහාබාවරුන්ව සිය දෑසින් දැක අනුගමනය කළ දනන්) කියාමත් දිනය දක්වා මෙම අයවලුන්ව අනුගමනය කරමින් සිය දිවිපෙවත සකස් කරන ජනයන්ව හඳුන්වයි.ඔවුහු ජයග්‍රහනයට ලක්වූ කණ්ඩායම ඔවුහුය. එබැවින් මොවුන්ගේ මාර්ගයෙහි ගමන් කරන සියළු දෙනා සමහර අවස්ථාවන්හිදී වැරදි කළද ඔවුහු ජමාඅත් පාර්ශ්වයට අයත්වූවන් සේ සළකනු ලැබේ.

2) ඉස්ලාම් ධර්මය තුල බෙදීම් ඇති කිරීම හා මුස්ලිම්වරුන් අතර බේදය නොසන්සුන් තත්ත්වයක් ඇති කිරීම නොමනා ක්‍රියාවකි. ඉස්ලාම් ධර්මය

සම්බන්ධව මුස්ලිම්වරුන් අතර විවිධවූත්, විෂමවූත් මත හා අදහස් ඇතිවන කල්හි අල්කුර්ආනය, මුහම්මද් නබි (සල්) තුමානන්ගේ මගපෙන්වීම සමග සලෆුස් සාලිහීන්වරුන්ගේ මාර්ගෝපදේශයද මුල්කර ගෙන සියළුම ප්‍රශ්න සහ ගැටළු සඳහා විසඳුම් ලබාදිය යුතුයි.

3) මුස්ලිම්වරුන්ව එක්සේසත් කිරීමේ සන්ධානය හෙවත් ජමාඅතයෙන් වෙන්වී යන උදවියට දැනමුතුකම් කියාදී නැවත ඉස්ලාමීය රාමුව තුලට කැඳවීම සඳහා පිළියම් යෙදීම හා ඔවුන් සමග සතුටු සාමීචියෙන් සංවාදයක යෙදී ඔවුන්ගේ ක්‍රියා කලාපය වැරදි බව පෙන්වා දීම,ඉස්ලාමීය ඉගැන්වීම් සාධක ලෙස ගෙන හැර දක්වා සත්‍ය වටහාදීම අනිවාර්යවේ. මෙම මගපෙන්වීම අනුව කෙනෙකු තමන්ගේ වරද වටහාගෙන, අල්ලාහ්ගෙන් පාපොච්චාරනය කර, සමාව අයැද සිටින්නේ නම් ඔහු යහපත් පුද්ගලයකු සේ පිළිගනු ලැබේ. මෙම ඔවදන් ප්‍රතික්ෂේප කරන්නේ නම් ෂරීඅත් ව්‍යවස්ථාවට අනුව ඔවුහු දඬුවමට ලක්විය යුතුයි.

4) කිතාබ්, සුන්නාහ්, ඉජ්මා, යන ක්ෂෙත්‍රය යටතේ ඇති (ගැටළු සහගත නොවූ) පැහැදිලි ඉගැන්වීම් අනුව ජනතාවට මග පෙන්වීම අනිවාර්ය වේ.

ග්‍රහනය කරගැනීමට අපහසු සියුම් කරුණු හා ගැඹුරු අදහස් ඔවුන්ගේ මනසට ඇතුල් කිරීමට උත්සක වීම තුලින් මුස්ලිම් සමාජය අපහසු තත්ත්වයට පත් කිරීම සුදුසු නොවේ.

5) සියළුම මුස්ලිම්වරුන් දෙස සුභවාදී ලෙස බැලීම යහපත්වේ. සියළුම මුස්ලිම්වරුන් අචල විශ්වාසයකින් හා හොඳ හැසිරීමකින් යුක්තවූ අයවලුන්ය; යන අදහස අප සිත්සතන් තුල නැති කල්හි ඉස්ලාම් මත විරෝදී පිරිසක් ලෙස ඔවුන් පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීම වැරදි සහගත ක්‍රියාවක්වේ. ඔවුන්ගේ අදහස් පැහැදිලිව සුදුසු ලෙස වටහා ගත යුතුයි. කෙනෙකු සිය අදහස් කෙරෙහි පමනක් එල්ඹ ගෙන සිටින කෙනෙකු ලෙස හෝ වැරදිහැසිරීමකින් යුක්තවූ කෙනෙකු ලෙස ඔප්පු වූ විටක පමණක් ඔහුගේ කථා හා ක්‍රියා රටාව කෙරෙහි සුභවාදී ලෙස බැලීම හෝ ඔහුට නිදහසට කරුණු සෙවීම කළ නොහැක.

6) නබි (සල්) තුමාගේ ඉගැන්වීම්වලට පටහැනිව ක්‍රියාකරන ජනයා විනාශයට හා නිරයේ වේදනාවට අයත් වූවන් ලෙස අනතුරු අඟවන ලද ජන සමූහයකි. (මේ අය අතුරින් බාහිර වශයෙන් මුස්ලිම්වරුන් ලෙසද අභ්‍යන්තරව කාෆිර්වරුන් වශයෙන්ද කටයුතු කරන අයවලුන් හා විශ්වාසය

පිළිබඳ සලෆ්වරුන්ගේ සංකල්පයට පටහැනිව කටයුතු කරන්නන් හැර) පොදුවේ අනිකුත් ජනයාද නිරයේ වේදනාව හා විනාශය පිළිබඳ අනතුරු අඟවන ලද දනන්ගේ තත්ත්වයට සමානය. ඉස්ලාම් ධර්මය අත්හල සියළු දෙනාම කාෆිර්වරුන් (ප්‍රතික්ෂේප කරන්නන්) වෙති. මොවුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළයුතු නීතිය මුර්තද් (ඉස්ලාම් ධර්මයෙන් ඉවත්වූවන් ) සම්බන්ධ නීතියට සමානය.

7) ජුම්ආ සහ ජමාඅත් සාමුහික සලාතය ඉස්ලාම් ධර්මයේ විශිෂ්ඨ දේව මෙහෙයක් සහ ඉස්ලාමය මප් නංවන භාහිර සංකේතයක්දවේ. කෙනෙකුගේ ක්‍රියා රටාව, හැසිරීම් රටාව, ඉස්ලාමයට එකඟද නැද්ද යනුවෙන් තීරණය කිරීමට නොහැකි අවස්ථාවක ඔහුව සාමුහික සලාත් මෙහෙයැවීම සඳහා (ඉමාම් වශයෙන්) පත් කිරීමට හැක. එබැවින් කෙනෙකුගේ ආගමික විශ්වාසය හා සංකල්පය පිළිබඳ තත්ත්වය කුමක්ද? යනුවෙන් තේරුම් ගැනීමට නොහැකි අවස්ථාවක (සාමුහික සලාතයේදී) ඔහු පිටිපස සිට මඃමූන් වශයෙන් සලාත් ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීම බිද්අත්වේ.

8) යහපත් මුස්ලිම් කෙනෙකු පිටු පස සලාත් ඉටුකිරීමට හැකි අවස්ථාවක බිද්අත් හා පාපී ක්‍රියා

ප්‍රසිද්ධියේ කරන මුස්ලිම් කෙනෙකුගේ ඉමාමත් යටතේ සලාත් ඉටු කිරීමෙන් වැළකී සිටීම අවශ්‍ය වේ. එසේ ඔහු පිටු පස සලාත් ඉටු කිරීමට සිදුවුවහොත් එම සලාතය වලංගු වේ. නමුත් මෙසේ සලාතය ඉටු කලයුත්තේ වෙනත් අතුරු ප්‍රශ්න හා පාපී ක්‍රියාවෙන් වැලැකී සිටීමේ අදහසිනි. මෙවැනි කොන්දේසියකින් තොරව ඔහු පිටු පස සලාත ඉටුකිරීම පාපී ක්‍රියාවකි. බිද්අත් හා නරක ක්‍රියා අතින් ඉතා දරුණු හා පහත් තත්ත්වයක සිටින ඉමාමත් පිටු පස සලාත් ඉටු කිරීමට වඩා ඉහත සඳහන් කළ බිද්අත් ක්‍රියාවන්හි නිරතවන ඉමාම් පමණක් සිටින මොහොතක එම ඉමාම් යටතේ සලාතය ඉටු කිරීම අගනේය. මෙවනි අවස්ථාවක මෙම ඉමාම් සමග සලාත් ඉටු කිරීමෙන් වැළකී සිටීමට නොහැක. කාෆිර් යනුවෙන් කෙනෙකුව හරි හැටි තීරණය කිරීමෙන් පසු ඔහුගේ ඉමාමතය යටතේ ඉටු කරනු ලබන සලාතය නිශ්ඵල වේ.

9) සමාජයේ ඒකමතික තීරණය හෝ ඔවුන් අතුරින් උගත් වැදගත් අයගෙන් සමන්විත මණ්ඩලයක මනාපය අනුව "ඉමාමතුල් කුබ්රා" හෙවත් සමාජයමය හා දේශපාලනමය නායකත්වය සඳහා කෙනෙකුට ප්‍රතිඥා දීමෙන් පසු එම පදවියට ඔහුව පත් කිරීමට හැක. මෙසේ කෙනෙකුව පත් කල යුත්තේ ඔහුට ජනතාවගේ ප්‍රශ්න විසඳීමට හා

පාලනය කිරීමට හැකියාවක් හා දක්ෂතාවයක් ඇතිවිටක පමණයි. මෙසේ ජනතාවගේ කැමැත්ත අනුව තෝරා පත් කරගත් නායකයාට ඉස්ලාමීය ඉගැන්වීම් වලට අනුකූලව යටහත්භාවය දැක්වීමත්, ඔහුට අවශ්‍ය විටක උපදෙස් දීමත්, අනිවාර්ය වේ. අල්ලාහ් තආලාගේ අණට විරුද්ධවූ ඉතා පැහැදිලි කුෆ්ර් ක්‍රියාවක් එම නායකයා විසින් කරන බවට ඔප්පු කරනු ලැබූ විටක හැර වෙනත් හේතූන් මුල් කරගෙන ඔහුට විරුද්ධව කටයුතු කිරීම (තහනම්) හරාම් වේ.

10) මුස්ලිම් නායකයින් අපරාධ කරුවන් වුවද සලාතය, හජ්, ජිහාද් යන වගකීම් ඔවුන් සමග එකතුවී ඉටු කිරීම අනිවාර්යවේ.

11) ලෞකික ලාභයක් බලාපොරොත්තුවෙන් හෝ වැරදි හැඟීමක් මුල්කරගෙන මුස්ලිම්වරුන් සමග සටන් කිරීම හරාම් (තහනම්) වේ. මෙය මහා පාපී ක්‍රියා සතයට අයත්වේ. බිද්අත්, මහාපාපී ක්‍රියාවන් හා මේ හා සමාන වෙනත් ක්‍රියාවන්හි නිරත වූවන් හොඳ මාර්ගයෙන් මුදවා ගැනීමට නොහැකිවූ විටක පමණක් ඔවුන්ට විරුද්ධව සටන් කිරීමට අවසර ඇත. යුද්දයෙන් ඇතිවිය හැකි යහපත් ප්‍රතිපල හා අවස්ථාවට උචිත තත්ත්වයන් පදනම් කරගෙන

සමහර විට ඔවුන් සමග සටන් කිරීම ශරීආ අනුව අනිවාර්ය වේ.

12) ගෞරවනීය සහාබාවරුන් සියළු දෙනාම යුක්ති සාධාරනව කටයුතු කළහ. මෙම සමාජයේ (උම්මතයේ) අති ශ්‍රෙෂ්ඨවූ අය සහාභාවරුන් වෙති. ඔවුන් ඉස්ලාම් පිළිබඳ අචල විශ්වාසයකින් හා වැදගත් තත්ත්වයකින් ජීවිතය ගත කළහ. මෙම කාරනාව කිසිවෙකුට හෙළා දැකීමට නොහැක.මන්ද මෙම කාරනාව සියළු සාක්ෂින් හා සාධක මුල්කරගත් හා ඉස්ලාමීය ධර්මයට අනුකූලව සියළු දෙනා විසින් අත්‍යවශ්‍ය ලෙස දැනගත යුතු සත්‍යවූ පුවතක් වේ. සහාබාවරුන් කෙරෙහි දයාව දැක්වීම ඊමාන් විශ්වාසය හා සම්බන්ධ ඉස්ලාමීය අංගයක් වේ. ඔවුන්ව අගෞරවයට ලක් කරමින් හෙළා දැකීම කුෆ්ර්, නිෆාක් (වංචනීය) ක්‍රියාවකි. සහාභාවරුන් අතර ඇතිවූ ප්‍රශ්න ගැන කථා කිරීමෙන් වැළකී සිටීම හා ඔවුන්ගේ ගෞරවයට හා චරිතයට හානි පමුණුවන කරුණුවලින් වැලකී සිටීම අනිවාර්ය වේ.

කුලෆාඋර් රාශිදූන් (සුමග ගමන් කළ නායකයන්) වූ අබුබක්ර්,උමර්,උදුමාන් සහ අලි යන අයවලුන් පිළිවෙලින් සහාභාවරුන් අතුරින් ශ්‍රෙෂ්ඨවන්තයෝ වූහ. එපමණක් නොව මෙම සිව්දෙනා සිය තත්ත්වය

හා තරාතිරම අනුව පිළිවෙලින් හා නීත්‍යානුකූලව කිලාපත් දුරයට පත්වූ බව කිසිදු සැකයකින් තොරව පිළිගත් සත්‍යයකි.

13) නබි(සල්) තුමාණන්ගේ අහ්ලුල් බෛත් හෙවත් පවුලේ ඥාතීන් කෙරෙහි ආදරය දැක්වීම, ඔවුන්ව තමන්ට ඉතා හිතවත් අය හැටියට පත් කර ගැනීම උම්මහාතුල් මුඃමීන් වරුන්වූ එතුමාගේ අඹුවන් උසස් ලෙස ගෞරවයට පාත්‍ර කිරීම, ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය ගැන දැන ගැනීම ඉස්ලාම් විෂයට සම්බන්ධ කරුණු වේ. එසේම සලෆී සමාජයට අයත් ඉමාම්වරුන්, සුන්නත් වල් ජමාඅත් උලමාවරුන්, මොවුන්ව නිසියාකාරව අනුගමනය කළ අයලුවන් කෙරෙහි ලැදියාවක් දැක්විය යුතුයි. මේ හැරුනු විට ආගමට විරුද්ධවූ බිද්අත් ක්‍රියාවන්හි යෙදෙන හා හිතට වහල්වී ක්‍රියා කරන්නන්ගේ ආශ්‍රයෙන් ඈත්වී කටයුතු කිරීමත් ආගමට සම්බන්ධ ක්‍රියාවක් වේ.

14) අල්ලාහ්ගේ මාර්ගයෙහි ජිහාද් කිරීම ඉස්ලාම් ධර්මයේ අති උතුම්වූ වන්දනාමානයක්වේ. මෙය යව්මුල් කියාමා හෙවත් අවසන් දිනය දක්වා ඉටුවිය යුතු වගකීමකි.

15) ඉස්ලාම් ධර්මයේ අණකර ඇතිදේ ජනතාවට ප්‍රචාරය කිරීම, ඒවා අනුගමනය කරන ලෙස අණ

කිරීම, අකුසල් ක්‍රියාවන්වලින් වැලැකී සිටින ලෙස අවවාද කිරීම, යනාදිය ඉස්ලාම් ධර්මයේ ප්‍රධාන වගකීම් අතරට අයත්වේ. එපමණක් නොව මෙම වගකීම ඉස්ලාමීය සමාජ ක්‍රමය බිඳ වැටීමකින් තොරව ආරක්ෂා කිරීමටද රුකුලක්වේ. තම තමන්ගේ ශක්ති ප්‍රමාණයට අනුව අන් අයට යහපත් දේ ගැන අවවාද අනුශාසනා කිරීමත්, අයහපත් තත්ත්වයට පත්නොවීමෙන් එම දනන් ආරක්ෂා කිරීම හා අයහපත් තත්ත්වයට පත්වූ දනන් ඒ තත්ත්වයෙන් මුදවා ගැනීමත්, අනිවාර්ය වේ. ඉහත සඳහන් යහපත් ක්‍රියාවන්හි යෙදෙන්නන් සමාජයේ සුභසිද්ධිය කෙරෙහි හිතෛෂී භාවයකින් යුක්තව මෙම ක්‍රියාවන්හි නියලිය යුතුයි.

## <u>අහ්ලුස් සුන්නාහ් වල්ජමාඅත් වරුන්ගේ වැදගත් කම හා ඔවුන්ගේ ක්‍රියා කලාපය</u>

අහ්ලුස් සුන්නත් වල් ජමාඅත් යන කණ්ඩායමට අයත් පිරිස පමණක් විමුක්තිය ලබාගත් හා අල්ලාහ් ගේ උදව් උපකාරයට උරුමවූ කණ්ඩායමක් වශයෙන් හඳුන්වමු. ඔවුන් අතරද උස් පහත් තත්ත්වයක් දක්නට ලැබුනද පොදුවේ වෙනත් දනන් අතර දක්නට නොලැබෙන ඔවුන්ටම ආවේනිකවූ ගුණාංගද ඔවුහු සතුව ඇත. ඒවායින් සමහරක් පහත සඳහන්වේ.

1 අල්ලාහ්ගේ කුර්ආනය කෙරෙහි ඇති ලැදියාව

අල්කුර්ආනය පාරායනය කිරීම, වනපොත් කිරීම, එහි අර්ථවිවරණය දැන ගැනීම කෙරෙහි විශිෂ්ට ලෙස උනන්දු වීම, අල්හදීස් පිළිබඳ අවබෝදයක් ලබා ගැනීමට උනන්දු වීම, එහි අර්ථය හොඳින් වටහා ගැනීම, හදීස් අතරින් සහීහ් (පවිත්‍ර) හදීස් හඳුනා ගැනීමට උනන්දු වීම, මෙසේ ලබා ගත් දැනුම අනුව සිය ජීවිතය සකස් කරගැනීම.

2) ඉස්ලාම් ධර්මය තුලට අංග සම්පූර්ණ ලෙස ප්‍රවිශ්ඨ වීම හා අල්කුර්ආනයේ සඳහන් සියළුම කරුණු කෙරෙහි විශ්වාසය පිහිටුවීම, අල්කුර්ආනයේ කළ යුතුයි යනුවෙන් අණකර ඇති හා නොකරන ලෙස වළක්වා ඇති කරුණු, අල්ලාහ්ගේ ලක්ෂණයන් හා ගුණාංගයන් සම්බන්ධව අල්කුර්ආන් අනුමත කර ඇති ක්‍රියාවන් හා ප්‍රතික්ෂේප කර ඇති ක්‍රියාවන් ගැන හොඳින් අවබෝද කරගනිමින් ඒවා ඇතිසැටියේ පිළිගැනීම; අල්ලාහ්ගේ පූර්ව සැළැස්ම පිළිබඳ විශ්වාස කරන අතර මිනිසාටද සිතීම, තීරණය කිරීම හා ක්‍රියා කිරීමේ නිදහස ඇතිබව විශ්වාස කිරීම; දැනුම ලබාගැනීම කෙරෙහි උත්සක වීම, එම දැනුම (ඉබාදතයක් ලෙස) දෛනික ජීවිතයේදී ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම; වීර්යය,

කරුණාව යන ගුණාංග වර්ධනය කර ගැනීම; හේතුඵල සාදක කෙරෙහිද සැළැකිලිමත් වීම හා Zසුහුද් හෙවත් ජීවිතයේ හික්මීමක් හා දමනයක් ඇතිකර ගැනීම.

3) අල්කුර්ආන් සහ සුන්නාවෙහි මූලධර්මයන් ඇති සැටියේ පිළිපැදීම, ඉස්ලාම් ධර්මයේ නවීන දේ ඇතුලත් කිරීමෙන් වැළකී සිටීම, ඉස්ලාම් සම්බන්ධ ප්‍රශ්න වලදී විවිධ මත හා අදහස් දැරීම තුලින් පිල්වලට නොබෙදී එක්සත්ව සිටීම.

4) සහාබාවරුන් හා ඔවුන්ගේ මග ගිය නීති ගරුක ඉමාම්වරුන්ව අනුගමනය කරමින් සුමග ගමන් කරමින් ඉල්මු, අමල්, දඃවා, (දැනුම, ප්‍රායෝගික ක්‍රියාව, ප්‍රචාරය) යන විෂයන්හි ඔවුන් ගත් මගෙහි ගමන් කිරීම, ඔවුන්ගේ ක්‍රියා රටාවට පටහැනිව දිවි පෙවත ගත කළ අයවලුන්ගේ මාර්ගයෙන් වැළකී සිටීම.

5) මධ්‍යස්ථ ප්‍රතිපදාව : ඊමාන් විශ්වාසය පිහිටුවීමේ විෂයෙහිදී අන්තවාදී ලෙස හෝ ඊට ඉඳුරා ප්‍රතිවිරුද්ධ තත්ත්වයට පත්නොවී මධ්‍යස්ථ ප්‍රතිපදාව අනුගමනය කිරීම. ඉස්ලාමීය කටයුතුවලදී කාර්යක්ෂමව හා උනන්දුවකින් කටයුතුකිරීම. අන්තවාදී හෝ

මන්දගාමී පිළිවත අනුගමනය කිරීමකින් තොරව මධ්‍යස්ථව කටයුතු කිරීම.

6) සත්‍ය මාර්ගය කරා මුස්ලිම්වරුන්ව එක්සත් කිරීම කෙරෙහි උනන්දු වීම :

අල්කුර්ආන් සුන්නාහ් යටතේ ජනයා එක්සත් කිරීම, ඔවුන් අතර මතභේදවලට තුඩු දෙන සියළු කරුණුවලින් ඔවුන් මුදවාගැනීම, ඔවුහු තමන්ව සුන්නත් වල් ජමාඅත් යනුවෙන් හඳුන්වා ගන්නා අතර ඉස්ලාම් ධර්මයට සම්බන්ධ මූලික කරුණුවලදී සමාජයෙන් බෙදී ඉවත්වන්නේ නැත.ඔවුන්ගේ එක්වීම හා වෙන්වීම අල් කුර්ආන් හා සුන්නාහ් යටතේ මිස වෙනත් න්‍යායන් යටතේ සිදුවන්නේ නැත.

7) අල්ලාහ්ගේ ධර්මය ප්‍රචාරය කිරීම, ඉස්ලාම් අණ කළ දේ කෙරෙහි ජනයා කැඳවීම, තහනම් කළදෙයින් ජනයා වළක්වාගැනීම, ජිහාද් හා සුන්නා යන කෙෂ්ත්‍රයන් ජීවමානව පවත්වාගෙන යාම, සුන්නාහ් ජීවමාන කිරීම තුලින් හා බිද්අත් හා නවීන කරුණු (සමාජයෙන්) ඉවත් කිරීම තුලින් අල්ලාහ්ගේ ධර්මය ප්‍රකෘතිමත් කිරීම සඳහා කටයුතු කිරීම. ඉස්ලාම් ධර්මය නගා සිටුවීම සඳහා සුළු හා මහා පරිමාණයේ කරුණුවලදී අල්ලාහ්ගේ ශරීඅත් අනුව හා එහි නීති රීති අනුව ක්‍රියා කිරීම,

8) නීතිය සර්ව සාධාරන ලෙස ඉටුකිරීම
අල්ලාහ් උදෙසා යම් කිසි කර්තව්‍යයක් ඉටු කිරීමේදී පෞද්ගලික වාසිය හෝ තම කණ්ඩායමේ වාසිය ගැන නොසලකා එම කටයුත්ත නිසියාකාරව ඉටු කිරීම. මේ නිසා ඔවුහු ඥාතී හිත මිතුරන් සඳහා කිසිදු පාලනයකින් (අපක්ෂපාතී තත්ත්වයෙන්) තොරව හෝ හතුරන් සඳහා අසාධාරන ලෙසට හෝ යුක්තිය පසිඳලන්නේ නැත.කුමන තරාතිරමකට අයත් කෙනෙකු හෝ වේවා සියළු දෙනාටම ඔවුනොවුන්ගේ තත්ත්වයට අනුව වැදගත් තැනක් ලබා දීමේදී අසාධාරනය ඉටු කරන්නේ නැත.

9) ඔවුහු යුගයෙන් වෙනස් වුවද ස්ථානයෙන් දුරස්ථ වුවද ඉස්ලාමීය දැනුම සම්බන්ධ විෂයෙහිදී සම්මත ක්‍රමයකින් හා ක්‍රියාකාරී රටාව අතින් ඒකීයත්වයකින් යුතුව කටයුතු කරති. ඉස්ලාමීය දැනුම ලබා ගැනීමේ (මූල ධර්ම) විෂයෙහි මොවුන් අතර දක්නට ලැබෙන ඒකීය භාවයෙහි ප්‍රථිපලයක් වශයෙන් මෙසේ ඔවුන් අතර සාර්ථක තත්ත්වයක් උදාවී ඇත.

10) පොදුවේ ජනයා සමග ආදරයෙන්, කරුණාවෙන් හා හිතෛශී භාවයකින් යුක්තව ආශ්‍රය කිරීම හා කටයුතු කිරීම.

11) අල්ලාහ් තආලා, අල්ලාහ්ගේ අල්කුර්ආන්, අල්ලාහ්ගේ රසූල්, මුස්ලිම් පොදුජනයා, සහ ඔවුන්ගේ නායකත්වය යනාදී වශයෙන් සියළු දෙනා හා සියළු දේ කෙරෙහි ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් කලට වේලාවට නිසියාකාරව ඉටුකරති.

12) මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්න වලදී ඒ සඳහා විසඳුම් ලබා දීම, ඔවුන්ට උදව් උපකාර කිරීම සඳහා ප්‍රරෝ ගාමීත්වයෙහිලා කටයුතු කිරීම, හිරිහැර බාධා කම්කටොළුවලින් ඔවුන් මුදවා ගැනීම. ඔවුන් සඳහා ඉටු කළ යුතු යුතුකම් නිසියාකාරව ඉටුකිරීම.

*( සියළු පැසැසුම් අල්ලාහ්ට හිමිවේ )*

**අහ්ලුස් සුන්නත් වල් ජමාඅත්වරුන්ගේ**

# *මූලික විශ්වාසය*

**කතෘ**

මහාචාර්ය : නාසිර් අබ්දුල් කරීම් අල් අක්ල්

සිංහල අනුවාදය

මුහම්මද් නලීම් ඉස්සදීන්